ISSN 2950-6999

# නිර්මාණී e MAGAZINE

# සහකම්පනය

VOLUME 2 | ISSUE 1 | OCTOBER 2023

**මෙවර කලාපය සහකම්පනය සහිත යහපත් සමාජයක් නිර්මාණය කිරීම උදෙසා පිදෙන වගයි**

Students
TEACHERS
EDUCATION OFFICERS
Community Membmers
Parents




කවි ගී චිත්‍ර නිසඳැස් පෝස්ටර්

Distance Learning Mission - Sabaragamuwa Provincial Department of Education
Volume Two- © 2023 Department of Education Sabaragamuwa

# Editorial Board




Guidence and Instructions-

**Mr. Lakmal Eranda Kumara**
Deputy Director of Education
Sabaragamuwa Province

Supervision

**Mr. S.P. Jesupillai**
Assistant Director of Education
Sabaragamuwa Province

Editor-in-Chief

**Mr. Janaka Pushpakumara**
Sri Lanka Teacher Service
Kahawatta Central College
Kahawatta

Co-Editor

**Mrs. H.M.A. Sumithra Herath Menike**
Sri Lanka Teacher Service
ITDLH
Balangoda

Editors

**Mr. H.M. Wijewardana** - Rambuka Maha Vidyalaya
**Mrs. P. Sirilani Fonseka** - ITDLH Balangoda
**Mr. B.L. Sarath Bogahapitiya**-ITDLH Godakawela
**Mr. H.S.N. Ranjith** - ITDLH Kolonna
**Mr. G.R.M.J. Thilakarathne** - ITDLH Mawanella
**Mrs. M.R.F. Rizana Razick** - KG/MW/ Baduriya Central College
**Mr. M.B. Manjula Prabhath Jayarathne** - ITDLH Balangoda
**Mrs. H.M. Neluka Gunathilaka** -ITDLH Balangoda
**Mr. W.K.T.C. Amarasiri** - ITDLH Kolonna
**Mrs K.K. Irosha Udayangani** -ITDLH Balangoda
**Miss W.D.K. Madhushika** - Atalugama Edu. Center
**Miss Y.O. Amarasinghe** - R/Kahawatta Central College RNCOE Internee

Technical Editor

**Mr. A.M. Rajah** Education Research Center Atalugama

සබරගමු පළාතේ ලේඛක ලේඛිකාවන්ගේ
නිර්මාණ හැකියාව ඔප්නංවාලීමේ අරමුණ ඇතිව සහ
නිර්මාණී දෙවන කලාපයේ නිර්මාණ කරුවන්
දිරිගැන්වීම පිණිස
තේමාවට අදාළ සියලු නිර්මාණ
මෙම සඟරාවට එක් කිරීමට තීරණය කළ බැවින්
නිර්මාණශීලීත්වය
විවිධ මට්ටම් වල තිබිය හැකි බව
සහෘද පාඨකයන් වෙත
ගෞරවයෙන්
දන්වා සිටිමි.

සියළුම ක්‍රියාදාමයන්හි ලා නව තාක්ෂණය යොදා ගනිමින් ක්‍රියා කරනු ලබන කාල වකවානුවක් තුළ නව තාක්ෂණය මුසු කරගනිමින් බොහෝ විෂය සමගාමී ක්‍රියාකාරකම් රැසක් මෙහෙයවන ඊ-නැණපියස මෙහෙවරේ "නිර්මාණී" මාර්ගගත සඟරාවට සුවිශේෂී තැනක් හිමි වේ.

කිසියම් තේමාවක් මුල්කරගනිමින් සය මාසිකව එළිදැක්වෙන නිර්මාණී මාර්ගගත සඟරාව මෙවර "සහකම්පනය" තේමා කරගැනීම ද මම අගය කරමි. අනෙකා තලා පෙළා, ප්‍රචණ්ඩත්වය සාමාන්‍යකරණය වූ අවස්ථා අපට නිතර දක්නට ලැබේ. අනෙකාගේ සිතුවිලි හඳුනන මිනිසුන්ගෙන් සමාජයට අවැඩ සිදු නොවේ. මෙවන් තේමාවකින් මෙවර **නිර්මාණී** සැරසීම අතිශය කාලෝචිත ය.

සබරගමුව පළාතේ හා ඉන් පිටත දරු දැරියන්, ගුරුවරුන් හා වෙනත් අයගේ නිර්මාණශීලීත්වය ඔප්නැංවීමට හා ඔවුනට අවස්ථාවක්, වේදිකාවක් තනා දීම ද මෙහි දී අගය කළ යුතුය. අධ්‍යාපන නිලධාරීන්ගේ නිර්මාණ මෙන් ම කුඩා දරු දැරියන්ගේ නිර්මාණ ද මෙහි අඩංගු වී තිබීම බෙහෙවින් අගය කළ යුතුය.

දේශීය ව හා ජාත්‍යන්තර ව සබරගමුව පළාත ඉහළින් ඔසවා තැබීමට සමත් වූ ඊ-නැණපියස හා සිප්තතු පද්ධති එකමුතුව විසින් සිදු කරන මෙම නිර්මාණශීලී සාර සංග්‍රහයට සබරගමුව අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි මෙන්ම පළාත් සභාවේ සුබපැතුම් එක්කරන අතර මෙය නිර්මාණයෙහි ලා ඇප කැප ව ක්‍රියා කළ සියළු දෙනාට මාගේ හෘදයාංගම ස්තූතිය පුදකර සිටිමි.



**උපාලි චන්ද්‍රකුමාර**
**සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ**
**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ගැටන්ගම, රත්නපුර**

පුද්ගල විවිධත්වයෙන් යුතු මානව සමාජය තුළ ජීවත් වීමේ දී අන්තර් පුද්ගල සබඳතා පවත්වා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. යහපත් මානව සබඳතා සහිත සුන්දර සමාජයක් නිර්මාණය කිරීමේ ලා "සහකම්පනය" නම් සුවිශේෂි මානව ගුණාංගයට අතිශය ඉහල වටිනාකමක් හිමි වේ.

අන් අයගේ හැසිරීම තේරුම් ගැනීමට හා ඒ අනුව කටයුතු කිරීමට හැකි සහකම්පනයෙන් යුතු මානව සමාජයක් බිහිවනු දැකීම අප කාගේත් ප්‍රාර්ථනය යි.

දිනෙන් දින සංකීර්ණත්වයට පත්වෙමින් ඉහල ආර්ථික ඉලක්ක කරා හඹා යන වර්තමාන මානව සමාජය තුළ සහකම්පනය මිනිසාගෙන් බොහෝ ඈතට ගොස් ඇති බව පෙනී යන කරුණකි. සහකම්පනය වෙනුවට ආත්මාර්ථය, වෛරය, ක්‍රෝධය, පළිගැනීම වැනි දූෂිතාංග වත්මන් සමාජයේ සුලභ වී ඇති අතර, ඉන් හටගත් ඛේදවාචකයන් පිළිබඳ දිනපතා අපට සාක්ෂි සපයයි.

මෙවැනි දූෂිත සමාජයක් නිවැරදි මගට ගෙන, එකිනෙකාගේ වටිනාකම් අගයන සහකම්පනයෙන් යුතු අනාගත පරපුරක් බිහි කිරීමේ වගකීම ඇත්තේ අධ්‍යාපනයට යි. එබැවින් දැනුම සමගින් යහපත් සංවේදී ආකල්ප වලින් යුතු ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කිරීමේ කාර්ය භාරය අධ්‍යාපනඥයින් වන අපට පැවරී ඇත.

ඒ අනුව යමින් සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දුරස්ථ අධ්‍යාපන අංශය මගින් මෙහෙයවන නිර්මාණී සඟරාවේ මෙවර කලාපයෙහි තේමාව ලෙස "සහකම්පනය" යොදාගෙන ඇත. මෙය බෙහෙවින් කාලෝචිත වන අතර සමාජය තුළ සියළු දෙනාගේ අවධානයට ලක් විය යුතු තේමාවක් ද වෙයි. මෙම සත්කාර්යය සඳහා කැප වූ බී.ජේ පුෂ්පකුමාර මහතා ප්‍රමුඛ සංස්කාරක මණ්ඩලය බෙහෙවින් අගය කරමු



**පුෂ්පකුමාර ඩයස්**
**අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන)**
**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ගැටන්ගම, රත්නපුර**

නිර්මාණශීලීත්වය හා රසවින්දනය ඔප්නැංවීම, සාහිත්‍යකාමී සන්සුන් මනසක් ඇති නිර්ප්‍රචණ්ඩ මිනිසුන් බිහිවීමට හේතු සාධක වේ. "පියගුණ" ගයමින් ඇරඹී නිර්මාණී මාර්ගගත සඟරාව මෙවර "සහකම්පනය" තේමා කරගැනීම තුළින් සහකම්පනය සහිත පරෝපකාරය හා පරානුකම්පාව පෙරදැරිකරගත් පරපුරක් බිහිකිරීමට බලපෑමක් ඇති කරනු ඇති බව මාගේ විශ්වාසයයි.

සිය ස්වේච්ඡා සේවය හරහා සිදුකළ ප්‍රබල සමාජ යහ බලපෑම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ UNV50 ජාත්‍යාන්තර සම්මානයෙන් පිදුම් ලැබූ සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඊ-නැණපියස මාර්ගගත මෙහෙවර විසින් සිදු කරනු ලබන ස්වේච්ඡා සමාජ මෙහෙවරේ තවත් සුවිශේෂී අංගයක් ලෙස නිර්මාණී මාර්ගගත සඟරාව හැඳින්විය හැකිය.

පාසල් දරුවන්ට ගුරුවරුන්ට පළාත් මට්ටමේ සඟරාවක නිර්මාණ ඉදිරිපත් කර ඒවා ඇගයීමට ලක් කර සහතිකකරණයට ලක්වීම තුළින් ලැබෙන පන්නරය හා අද්දැකීම් තුළ ශ්‍රී ලාංකික සාහිත්‍ය අඹරෙහි දිදුලන අනාගත කවියන් කිවිඳියන්ගේ අංකුර නිර්මාණී හරහා බිහිවිය හැකිය.

එබැවින් නිර්මාණී හරහා බිහිකරන සමාජ බලපෑම තුළින් ශ්‍රී ලංකීය ජන සමාජය "සහකම්පිතව" අනාගතය වෙනුවෙන් වඩා විනයවත් හා යහපත් පෞරුෂයකින් හෙබි පිරිසක් බිහි කරනු ඇති බව ට ශුභාශිංෂණ සමග විශ්වාසය පළ කරමි.

එසේම නිර්මාණී දෙවෙනි කලාපය වෙනුවෙන් වෙහෙසවූ සියළු දෙනාට මාගේ ස්තූතිය පුද කරමි. විශේෂයෙන් මෙවන් විෂය සමගාමී කටයුතු රාශියක් ක්ෂේත්‍රයට දායාද කරන ස්වෙච්ඡා කාර්යයන් හි නිරත වෙමින් සමාජයට යහපත් බලපෑමක් ඇතිකරන සුවිශේෂී කණ්ඩයම් හැඟීමකින් සිය වගකීම් ඉටුකරන ඊ-නැණ පියස තාක්ෂණික කණ්ඩායමට මාගේ ගෞරවය පුදකරමි.



**කේ. ලක්මාල් එරන්ද කුමාර**
**නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන)**
**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ගැටන්ගම, රත්නපුර**

”ඊ-නැණපියස දුරස්ථ අධ්‍යාපන මෙහෙවර මගින් ඉදිරිපත් කරන නිර්මාණී සඟරාවේ දෙවැනි කලාපයට සුභපැතුම් එක් කරන්නේ ඉතාමත් සතුටිනි. මෙම මාර්ගගත සඟරාව අර්ධ වාර්ෂික ප්‍රකාශනයක් ලෙස එළිදැක්වීම හා සෑම කලාපයක්ම නිශ්චිත තේමාවක් වටා කේන්ද්‍රගත වීම සැබවින්ම ප්‍රශංසනීයයි. මෙම වසරේ, තේමාව වන්නේ “සහකම්පනය” යන්නයි, එය අප බොහෝ විට පීඩනය සහ ප්‍රචණ්ඩත්වය සාමාන්‍යකරණය කිරීම දකින වර්තමාන සමාජය තුළ අවධානය යොමුකළ යුතු ගුණාංගයකි. මෙම තේමාව තෝරා ගැනීම කාලෝචිත පමණක් නොව සංවේදනය සහ අවබෝධය පෝෂණය කිරීමේ අර්ථවත් උත්සාහයක් ලෙස දැක්විය හැකිය.

තවද, සබරගමුව පළාතේ සහ ඉන් ඔබ්බෙහි සිටින දරුවන්ට, ගුරුවරුන්ට සහ පුද්ගලයන්ට ඔවුන්ගේ නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථාවක් ලබා දෙමින් නිර්මාණී ඔවුන්ගේ කවි ගී සිතුවම් වලින් සැරසීම වටිනා ව්‍යවහාරය කි.

සබරගමුව පළාතේ අධ්‍යාපනය දේශීයව හා ජාත්‍යන්තර මට්ටමට ඉහළ නැංවීම සඳහා ඊ-නැණපියස සහ සිප්තතු අධ්‍යාපන කළමණාකරණ පද්ධති වල දායකත්වය ප්‍රශංසාවට හා පිළිගැනීමට ලක්විය යුතුය. නිර්මාණී යතාර්ථයක් කිරීමට දායක වූ සැමට මාගේ ස්තූතිය පුද කරමි.




**එම්. ටී. එම්. අන්සාෆ් තවුස්**

**නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්)**

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ගැටන්ගම, රත්නපුර**

# Achieving Excellence Together

Enenapiayasa and Sipthathu technical teams, the driving forces behind Sabaragamuwa Province's official LMS and Education Management Information System, proudly display their numerous awards. These accolades recognize their unwavering commitment to advancing education through innovation and dedication, a journey made possible by the support of the educational community.



NBQSA -2022 (National ICT Award 2022)




APICTA -2022 (Asia Pacific ICT Award 2022)




Digital Excellence Awards -2022




E-Swabhimani -Merit Award - 2022




Best Web Merit Award - 2022




National Productivity Award (2020) - First Place




UNV-50 Volunteer award 2021




National Inginuity Award - 2023

www.enenapiyasa.lk

www.semis.lk

# “පියගුණ වරුණේන්”

ඇරඹි

නිර්මාණී සඟරාවේ

දෙවැනි වෙළුම

# “සහකම්පනය”

තේමා කරගනිමින්

ඔබ වෙත

ගෙන එන්නේ

ඉමහත් සතුටිනි.

අප කෙරෙහි ලෙංගතුකමෙන්

අප වෙත නිර්මාණ එවූ

සුවිශේෂී ලේඛක මණ්ඩලයට ද

මාගේ සහෘද කර්තෘ මණ්ඩලයට ද

ඊ-ඥානපියස තාක්ෂණික කණ්ඩායමට ද

මාගේ ගෞරවය හා ස්තූතියි පුදකරමි !



**ජානක පුෂ්පකුමාර**
**ප්‍රධාන සංස්කාරක**
**නිර්මාණී මාර්ගගත සාර සංග්‍රහය**

# මා අම්මාය නුඹට සිප්කිරි පොවන

දැලිකුණු ,ඉරුණු ඇඳුම් නැහැ,ආගන්තුක නුඹට
ඇල්වතුරත් රස බොජුනකි සාගින්නට
පන්තියේ මුල්ලකට ගුලි වෙමින් සිටියත් නිතර
නැහැ වියකුනේනම් කෝපි මල් හිනා මුව

නොදැරුවත් කුසයේ මා නුඹව
දැනෙනවා නොකියන කතාව
සිතුණා දිනක් කරන්නට විපරම්
එබුණා පුංචි පැලට හොරෙන්

පොල්අතු ඉටිකොළ වට කළ ඇගේ රජ මැදුර
ඈ අම්මාය අඩන වැළපෙන නංගිලාට
කියමින් රස කතා අනමින් කැව්වා බත්ගුලි
සමාවෙයන් මේ මට නැගුවාට දොස් නිතර නුඹට

දුවමින් පනිමින්, හනිකට වතුර අදිමින්
අඩන වැළපෙන පොඩිඋන් නලවමින්
නුඹ කරනා අපමණ මෙහෙය සිතමින්
කඳුලක් ආවා නෙතට මටත් හොරෙන්

අකුරුත් ගොලු වෙලා තැලුවාට ඔය හිත
නැහැ සමාව මටනම් මගේ හිතින්
ඉන්නම් හැමදාම ළංවී දිනනකන් හෙට දින
පමා නොවී වරෙන් දුවේ අකුරට
මා අම්මාය
නුඹට සිප්කිරි පොවන........

**ඒ. අයි. රාජිනී**






සහකම්පනය
2023 ඔක්තෝම්බර් කලාපය
e නිර්මාණී MAGAZINE
Distance Learning Mission Sabaragamuwa Provincial Department of Education



Volume Two - © 2023 Department of education Sabaragamuwa




## රහස

සුදු පාටින් බැබළිච්ච
කමිසෙ අද කහ වෙලා
සිනා මල් වැස්සුනු
මුහුණ ඇත මැලවිලා

වෙනදාට මා එක්ක
හිනැහිච්ච ඔබේ ඇස්
ගෙදර ගැන ඇහුවාම
ගියේ ඇයි තෙත් වෙලා

හද පතුලෙ අගුලු ලා
රකින්නට වෙර දරන
රහස ඇත ඇස් දෙකේ
ලියවිලා

මගේ බත් පතින් අද
නිවාගමු කුසගින්න
ජීවිතේ හැටි ඕක
වැඩක් නෑ දුක් වෙලා

මහ කතරෙ උනත් ඔය
පිපෙනවා පතොක් මල්
ඉතින් අපි ගොතාගමු
ජීවිතේ සිහින මල්

*බුද්ධිකා හසිනි බණ්ඩාර*

## සහකම්පනය

මිනිස් ගුණ දම්-තුරන් වී ඇති
දයාව කරුණාව- හද තුළ නොමැති
ලොවක් තුළ හිඳ- කියන්නෙමි අද
සහකම්පනය නම්- කුමක් දැයි

තවත් කෙනෙකුගෙ- හදේ ඇති දෙය
හැකිනම් වටහා ගන්න- මැනවින් ඔබට
ඔබට ඇත ඒ- උතුම් ධර්මය
සහකම්පනය යැයි- ලොවක් නම් ලද

වෙනත් කෙනෙකුගෙ- හදේ ඇති දුක
සමත් වේ නම් වටහ ගන්නට - පහව යයි
එම වැරදි අවබෝධ - ගැටලු දුරලා
සිත් සතොසින්

අනිකා වටහා ගැනීමෙන්- අපට හැක මෙම
කුරිරු ලොව තුළ - පෙරලි කරනට
යහපත උදෙසා - එකාවන්ව

සිනහව සහ ආදරය - වඩන්නට හැක
පලවා හැර එම - අඳුරු සමය

වියළි පොළොවට -මහා වැසි මෙන
වස්සවමු අපි- උතුම් ධර්මය
බිහි කරමු එම- උතුම් ලෝකය
සැමට සතුටද - ආදරය දෙන........

**ඩබ්. ඒ. චමිත් සඳකැන්**



## ආයුබෝවන් ටීච

හත වසරෙ පුංචි උන්
පැවසුවා මහ හඬින්

මල් කැකුළු වන් මුහුණු
අතර විය අමුත්තෙක්
හැඳ සිටිය කහ ගැසී
කිළිටි වුණ කමිසයක්...
කුහුල පිරි මා සිතට
සොයනු වස් පිළිතුරක්
තැබුවෙමි ඔහු දෙසට
දයාබර පියවරක්...

කමිසයේ තැනින් තැන
කහට පැල්ලම් පිරී
දිළිඳුකම සැඟව ගත්
සාක්කුව ඇත ඉරී...
සලිත වුණු මා හදෙහි
හැඟුම් සඟවනු බැරී
පිස ගතිමි කඳුළු බිඳු
විගස ඉවතට හැරී...

දැන ගතිමි ඔහුගෙ නම
මෙත්සිරි බව පසුව
පන්තියේ පිටුපසම
අසුන ගිමි නිරතුරුව...
දිනපතා උදෑසන
පන්තියට ගිය විගස
දිව එන්නෙ ඔහු මවෙත
තරුව ලැබ ගනු පිණිස...

ලියන්නට කියන්නට
අඳින්නට අත නුහුරු
පොතපතේ මුතු අකුරු
ඔහුට වී ඇත නපුරු...
අත් දෙකෙන් පොත රැගෙන
දසන් පා හිනැහෙමින්
මා වෙතට පැමිණ ඔහු
මෙලෙස ඇසුවා මගෙන්...

—ලස්සනට ලියන්නට
දන්නෙ නෑ මම ටීච
කැත අකුරු වලට මගෙ
තරු දෙන්නෙ නෑ නේද?"
නොසලකනු කෙලෙසකද
දයාබර පොඩිත්තෙක්
දුනිමි මම ලියන්නට
සරල වූ වැකි දෙකක්...

වාවගනු බැරි දුකක්
සිත පුරා තැවරුණා
හැමදාම ඔහු මෙලෙස
ලියන්නට හුරු වුණා...
ඔහුගෙ සගයන් ඔහුට
මහත් සවියක් වුණා
අසරණ වූ දෙනෙත් අග
නැගි කඳුළු වියැකුණා....

රන් පාට තරුව
කොළරයෙ කොනක
දැවටුණා....
මෙත්සිරි ත් සමග
මුළු පන්තියම හිනැහුණා....


සැබෑ අත්දැකීමක් ඇසුරෙන්
නිරාශා කලන්සූරිය
ර/ පලිගල විද්‍යාලය
ඇහැලියගොඩ .






Volume Two - © 2023 Department of education Sabaragamuwa

# ඇයටත් සිනාවක්

ගුරු ගෙදරට යනෙනා හැමදාම වගේ
හරි ලස්සනයි කියනවා පොඩි පැටව් මගේ
ඔයත් ලස්සනයි හොද දරුවා මගේ
කියනා විටදී උතුරා යයි සිනහ ඇගේ

ඇයි මගේ පුතේ ඇස් දෙක රතු වෙලා වගේ
යාළුවෝ හිනා වෙනවා නෑ අම්මා මගේ
හොඳ නෑ පුතේ සිත රිදවන කතා ඇගේ
ඔබටත් එවන් දේ වුණොතින් දුකයි අනේ

එදා පටන් මුව සිනහව වෙලා ඇගේ
බත් පත ගෙනත් දෙනවා නොවරදවාම වගේ
එක පවුලක් වෙලා පන්තියේ හැමෝම වගේ
අම්මා මමයි සොයුරන් පන්තියම ඇගේ

දුක සැප ඇගේ පවුලක් වී බෙදා ගමු
මටත් මෙහෙම වුණොතින් උපමාව ගමු
සිත නොරිදා හිනැහෙන්නට දිරිය දෙමු
අම්මා නැති අඩුව මොහොතක් පුරවා දෙමු

*එල්.ඒ.එන්.පී. ලියනාරච්චි*
*ර/ඇඹි/පනාමුර ම.වි.*





# "It's me"

For the sake of humanity
Please come to me
To share your pains, happiness or loneliness
Please come to me
Because..

I saw a pretty girl
With smiling eyes
Everybody praised her
I felt " it's me "

I saw a crying girl
With tearful eyes
Everybody ignored her
I felt " it's me "

I saw a poor dog
With oweful wounds
Everybody hurt him
I felt " it's me "

I saw a winner
With medals and prizes
Everybody cheered her
I felt " it's me "

I saw a mourning man
With a his dead pet
Everybody laughed at him
I felt " it's me "

It's me, it's me and it 's me I could see it's me in the mirror

**L. A. N. P. Liyanarachchi**
**R/ Emb/ Panamura M. V.**

# සුවඳ කූරු විකුණන්නී

අතක බරටම සුවඳ කූරැම
බෑගයක යන්නම් දරා
කූසක සත්මස පමණ වයසක
බිලිඳු දරුවෙකු වෙයි දරා
සොවක සලකුණු නැගෙයි දෑසක
සඟව ගත් කඳුලක පුරා
වතක වැහැරුණු විඩාපත් බව
තුරුණු දිවියම ඇත මරා

පියෙන් පියකට ගාටමින්
අද්දවා ඉදිමුණු දෙපා
සෙමින් දිගුකොට හිමි පුදන්නට
සුවඳ දුම් නොයනට අපා
සැපෙන් කල්-යල් ගෙවන උතුමන්
රවයි දෙතොලම සපා
පිනෙන් සපිරුණු අයෙක් ගතහොත්
එදා නම් ඇවිලෙයි ලිපා

මල් ගවුම ඇත පාට සේදී
කියනවා ලොකු කතාවක්
තෙල් බෙදන පිරවුම ළඟයි නිති
නැතිය රැය හා දවාලක්
සිල් බිඳින්නට සිදුවෙයිද තව
වරක් නොව කී වතාවක්
ඉල් මහේ මඟ වැරදුණානේ
දෙනුද කවරෙක් සමාවක්

**පී.එස්. උඩුවර ආරච්චි**

# ඇයි මේ ?

ඇයි මේ...?
කෑම ගෙනාවේ නැද්ද...?
නැහැ, අද ගෙදර ඉව්වේ නැහැ.
කමක් නැහැ, මගේ කෑම එක කමු..!

ඇයි මේ...?
ලියන්න පොතක් නැද්ද...?
නැහැ, අම්ම ළඟ සල්лි නැහැ.
කමක් නැහැ, මම පොතක් දෙන්නම්..!

ඇයි මේ...?
වෙන ගවුමක් නැද්ද...?
නැහැ, ගවුමක් මහන්න විදියක් නැහැ.
කමක් නැහැ, මගේ ගවුමක් දෙන්නම්..!

ඇයි මේ...?
ට්‍රිප් එක යන්නේ නැද්ද...?
නැහැ, මම අම්මට කියන්නේ නැහැ.
කමක් නැහැ, මම සල්ලි දෙන්නම්..!

ඇයි මේ...?
රැස්වීමට අම්මා එන්නේ නැද්ද?
නැහැ, ටීචර්, අම්මට නිවාඩු නැහැ.
කමක් නැහැ, පුතේ, අපි ට්‍රිප් එක යමු..!

ජී.ඩබ්.සුනිල් දයා


Volume Two - © 2023 Department of education Sabaragamuwa

නුඹට ඇත්තේ ද
*මාගේ බඩගින්න ම ය*
නුඹට දැනුණේ ද
*මාගේ සීතල ම ය*
නුඹ ගත ද දුවන්නේ
*මා සතු රුධිර ම ය*
නුඹ සතුව ඇත්තේ ද
*මා සතු කඳුළු ම ය*
නුඹ සතුටු වුයේ ද
*මා මෙන් සිනාසී ය*
එසේනම් මා මෙන්ම නුඹ ද
*ජීවිතයට කරනා ආලය*
මා දැනගත යුතුමය
*මම දනිමි හොඳින් ම*
මා සේම නුඹ ද
***මනුස්ස ප්‍රාණියෙකු බව,***

ඩබ්.වයි. සුභානි නිරූපමා ප්‍රේමතිලක

# දෙව්දුනි අසනු මැන....

දරුවකු සැබෑ නම් සෙනෙහස ලැබිය යුතූ
මව්පියෝ සැබෑ නම් දරුවන් රැකිය යුතූ
ගුරුවරු සැබෑ නම් පිහිට ට සිටිය යුතූ
මව්පිය දරු පවුල එක්කොට තැබිය යුතූ

මව් සෙනෙහස නැතිව දරුවන් නිවේවිද
පිය සෙනෙහස නැතිව දරුවන් රැකේවිද
මව්පිය වෙන්ව සැනසීමක් දැනේවි ද
දරුවන් නිවී සැනසෙන්නේ කෙලෙසක ද

සෙනෙහස දෙමින් සැනසුව ද මව්තුමිය
රැකවල් සදන්නේ ආදර පියතුමය
ලේ කිරි පොවන්නේ පුතු හට මව්වේය
තෙද බල පුතුට ලැබ දෙන්නේ පියතුමය

සුමන සමන් දෙවියනි මේ අසනු මැන
සුරතල් පුතුට හවි හරණක් සදනු මැන
මව්පිය දරු තිදෙන එක්කොට තබනු මැන
මතු බුදු වන්න පිංපෙත් ලබනු මැන

<u>පන්තියේ සිදු වූ සැබෑ සිදුවීමකි</u>

එච්.ඩී.එම්.ඩී.දිසානායක
ර/ඇහැ/ප්‍රා.විද්‍යාලය
(2 ශ්‍රේණිය අංශභාර)



සඟකම්පනය
2023 ඔක්තෝම්බර් කලාපය
e නිර්මාණී MAGAZINE
Distance Learning Mission Sabaragamuwa Provincial Department of Education
Volume Two - © 2023 Department of education Sabaragamuwa

## සහකම්පනය

මගේ සිත වගේමයි
අන් අයගේ සිත් රිදෙයි...
එක වචනෙකින් පවා
නොසිතූම දෙයක් වෙයි.
ආදරය කරණාව
හැමගේම සිතට දැනෙයි...
දුන් විට දී දයාගුණ
මුළු ලොවටම සෙත් පැතෙයි...
රිදෙවුවොත් එක සිතක්
නොදැන හෝ තම අතින්
සිතනු මැන ඒ සැනින්
මට වුණොත් ඒ ලෙසින්
දරා ගනු හැකිවේද,
හඬා වැටෙන්නට වේද...
තේරුම් ගන්නට
හැකිවෙතොත්
මොහොතකට,
අන් අයගේ සිත මදක්...
හැකිය මේ මුළු ලොවම
කරන්නට එක සිතක්...

ඩී.ජී. සෙනුලි සඳලිමා දිවෙල්ගම

## මිතුරියේ

පන්තියේ මුල්ලකට වී ඔබ
ඉන්න විටදි නෙත් සලා....
නුඹේ දුක් ගිනි මොනවදෝ යැයි
වටහා ගත හැක මට සිතා....
අකුරු කරනට තක්සලාවට ඇවිත්
සිටිය ද නුඹ මෙදා...
නුඹේ දුක ඇඳ තිබුණේ මූහුණේ
මගේ මිතුරියේ සෑමදා....
පිහිට වන්නට කෙතෙක් සිතුණ ද
නේක වර මගේ සිත් පුරා....
කෙලෙස නම් මන් පිහිට වන්න ද
මමත් නුඹෙ පන්තියෙ නිසා...
අකුරු කරමින් නිති ජයක් ගෙන
දුකේ කඳුලැළි පිස දමා....
කෙසේ හෝ අදිටන් කරනු මැන
ලොවේ කිරුළක් පළඳන සිතා.....

*ගිම්හානි ලෝෂිකා ගමගේ*


Volume Two - © 2023 Department of education Sabaragamuwa

ඉර අවරින් බැසයන දිනයක හවස
දුටුවා මවක නිවනා කුසගිනි පවස
බැල්ලක උනත් මතකේ රැඳවූ රහස
කවිපද කරන්නට අද නම් හොඳ දවස

තමන් බිහි කළත් දරුවන් මහ මගට
දමනා මවුන් අද ලොව තුළ ඇත එමට
සෙනෙහෙන් බඳා ළං කරගෙන පපු තුරට
පැටවුන් පහක් වැඩි නෑ වගේ මේ මවට

දූවිලි කකා තම පැටවුන් රකී ළඟම හිඳ
දුක සඟවා සැනසූණ ද හිඳ පැටවුන් මැද
හරිම හිඟයි නුඹවන් ආදර මවුවරු අද
එනමුදු නුඹ ගැන කවුරුත් දුටුවේ නැතිව ද

කෑමක් නැතත් මේ අම්මගෙ ඇඟට වැටී
පුදුමයි තුරුලු කර ඉන්නා ඇයගෙ පැටී
කැහැටු කමට පෙරවූ හම බිමට වැටී
තිබුණත් ඇගේ සෙනෙහේ මහමෙරක් වටී

**යූ. යෂිනි නමශ්‍රා**

# බොරපාට හීන

හවස වට වැස්ස මඩ කඩිති හරි සාරයි
මගට එන විකට දැක වතුර පිරි පාරයි
අඩිය නැති සපත්තුව අද ගෙදර දාලයි
අකුර ජය ගන්න බැස මගට එන වාමයි

බොර පාට ගවුම මැද අණ්ඩ සුදු පාටයි
අඟල අඩු දණහිසට බැනුම හැම දාටයි
වාටි දිග හැරිය මතක නැති වාර ගානයි
වේලුණේ නැති දාට ගෙදර වැඩ දාහයි

ලෙඩ ඇඳේ කෙඳිරියට අම්මා හැම දාමයි
ගෙදර එන අතරමග කසියා හරි ලාබයි
අඩු පාඩු හංගන්න අක්කා නම් මාරයි
ලිපේ ගිනි අවුලන්නේ එහෙමටත් දාකයි

බඩගින්න හුරු ගතට ඉගෙනුමත් බාරයි
රැස්වීම නිම වෙන්නෙ කලන්තය දාලයි
ඊයේ ඉදුණේ දවසටම බත් වළං කාලයි
නංගි නැවතුණේ නැගිටින්න බැරි පාරයි

වේවැලක් අත විනය අමනුස්ස පාටයි
කොණ්ඩෙ නම් වැවිල කාසි හිඟ ගානයි
ගෙදර වැඩ අතෑරියෙ තෙල් ඉවර පානයි
කමිසෙ ඉරිලා ඇත්තේ සෝදලම දාලයි

හිස් කෑම පෙට්ටිය දැක හීල්ලු නාමයි
බත් එක ළඟ තිබ්බෙ හිනැහවත් පාලයි
හිස බරට අතගෑවෙ දහිරියත් දාලයි
බත් මුලක් ආයේ නම් වැරදුණේ නෑමයි

පොත පතත් අඩු පාඩු ගෙනගියේ ඈමයි
පඩි දාට මෙලවුණේ මිට රුපියල්ම දාහයි
පන්තියේ බාර ඒ තුමිය හරි කරුණාවයි
ගමේ හැම මුවක රැව්දුණේ නම්බු නාමයි

**එම්.එච්. දිනේෂිකා මදුමලී**


Volume Two - © 2023 Department of education Sabaragamuwa

දුගී දුප්පත් ගෙපැල අස්සේ
සාගින්න දින දිනම ඉස්සේ
නැතත් රස බත් මාළු බිස්සේ
කඳුළු බත අඩු නොමැත තිස්සේ

අකුරු කරනා දරු පැටව් එම
යල මහට ගොඩවුණත් පොතකට
පදික වෙළෙඳුන් ලෙසින් මඟතොට
දැකිය හැක අදිනවා දිවි බර

ජන්ම දිනයට කේක් උස්සන්
වෙනදා නැති කම්පාව දිස්වන්
සැවොම හිඳ සෙල්ෆිය ද ගස්සන්
කුමට උන්ගේ බඩ අවුස්සන්

ගවුම්පොඩි කමිසයක් අඳවා
මවුපියන් නෙත් කඳුළු හරවා
බත් මාළු ගෙන කුස ද පුරවා
දෙන්ට හැක උන් සතුටු කරවා

හිසට සෙවණක් ලැබුණ දිනයක
වැසි කෝඩ නවතීවි ගේ දොර
කුසට අහරක් වැටුණු දිනයක
දුක් ගින්න නිමවේවි හැදොර

ආර්.ඒ. චිත්‍රාංගනී රණවක
ර/ගොඩකුඹුර ඉඹුලමුර විද්‍යාලය

දුගඳක තනි වු මව
සිවුදරු මවකි
ඇය මහමඟ සිටින
දරුවන් නිසා ඇය මේ
තැන සිටින....
සුන්දරයි කියා සිතුවද
ඇය මෙතන
ගන්ධය පිරුණු නගරය අද
ඇගෙ නිවස
මිනිසුන් නොමිනිසුන් වෙසෙනා
මේ නිවස සරණක් ගෙනෙයි අද තනි වූ
ඇගෙ හදට...
කන්නට දෙයක් දෙන තුරු
මඟ බලමින් හිඳින
බඩගින්න ද හිසරදයකි ඇය ට
ඇය කන බොන දේ පවා විටක දි
නීරසය....
ඇය තනියෙන් නොවේ තනියට
තව සුනඛයෙකු ය
මැය දකිද්දී උණු වෙයි මගෙ
හද මඬල
දරුවන් නිසා අද ඇය
මහමඟ ය .....

පී. තෝමස් ක්‍රිෂාන්ත

# සඳ අහිමි සාවියට.....

නිම්මා නොවී උතුරා යන සෙනෙහසිනී
පෙම්මා වඩා දරුදුක කකියන ලෙයිනී
සම්මා සම්බුදුන්ටත් නොදෙවෙනි ලෙසිනී
අම්මා නුඹේ මුළු ලොව බව මට දැනුණී

පියවර තබා පා පොඩි ඔසවා යසට
කඩිසර ගමන් මග සිහිවෙයි යස රුවට
පින්බර සිනාකැන් ලැබ දී සිතු ලෙසට
දිනකර ලෙසින් සිටියා දිරි දී සැමට

වෙහෙසක් නොගෙන නිබඳව සුන්දර වතින
වෙහෙසුණ හැටි දනිමි මව සමගින් දුකින
උහුලන විටදි දුක් ගිනි ඉවසා සිතින
නුඹගෙන් දිස් වුණේ මට-මාවයි නිතින

පින්බර මවුගෙ හද තුළ රැඳි දරු පෙම්මා
දින දින හද පිරී යනු මිස නැත නිම්මා
අන්සතු නොවී සැමදා බැඳෙනට බැම්මා
මතකද කියූ සැටි සිහි කර අපි අම්මා

නොඑනා ගමන් ගොස් මව නිදි සුව යහනේ
අහිමිව ගොසිනි ඇය හට තම මවගෙ සෙනේ
ගැහෙනා හදින් තුරුළුව මා වෙත පෙමිනේ
සාවිය ඇයයි සඳ අහිමිව නැත සරණේ

නුඹ දියණියකි තවමත් සිප්කිරි ලබන
මම ඇදුරිඳු ය නුඹගේ තනිකම මකන
අම්මා තරම් ළෙංගතු නැති මුත් සිතින
රකිනෙමි මගේ දියණිය ලෙස නුඹ නිතින

**බී.ආර්.ඒ. දීපිකා සුදර්ශනී**
**ර/ හිඳුරංගල විද්‍යාලය..**

# ඒ අයත් මම වගේ

අප්පච්චි කොහිද මේ
දිව යන්නෙ කලබලෙන්
ඇයි දන්නෙ නැද්ද දුව
හෙට ඔබේ උපන් දින
පාටියට සැරසෙන්න
ඉඩ දෙන්න ..චූටි දූ
පාටියට එන අයට
නෑදෑයො හිත මිතුරො
ඒ අයගෙ යාළුවොත්
හෙට නේද මෙහි එන්නෙ
අප්පච්චි

පුංචි කාලෙ මා බැලුව
රන් මැණික ඔත්පලව
නිදි යහනෙ තනි වෙලා
සුසුම්ලයි බල බලා
අමතකද අප්පච්චි

තේ වත්තෙ හැම වෙලේ
අපේ වැඩ ටික කෙරුව
මුත්තු අද තනි වෙලා
ඉවරයක් නැති වැස්ස
චිරි චිරිය මාසයක්
ගෙන ගියා නායවිත්
මුත්තුගේ බිරිය දුව

කොරෝනා ඇවිත් අද
ඔෆිසියේ වැඩ කරපු
කාන්තිත් ලෙඩ වෙලා
අතපයත් වෙව්ලලා
බෝ වෙනව කියල ඔබ
දිග නිවාඩුවක් දීල
මාසයක පඩිය දී
යැව්ව බව අමතකද?
අප්පච්චි

අප්පච්චි මේ අහන්න
මට ටිකක් ඉඩ දෙන්න
හෙට දිනේ යට කරන
ඒ සල්ලි කන්දරාව
මේ අයට දී එන්න
මගෙ සතුට ඇත්තෙ ඒ
සුසුම්ලන අය ගාව
අප්පච්චි නොසිතුවට
ඒ අයත් මම වගේ
හිතන්නකො අප්පච්චි.

මම වැරදි නෑ නේද????

**කේ.වී.එම්.එම්. කුමාරි**


Volume Two - © 2023 Department of education Sabaragamuwa

# සහකම්පනය

**පාරේ සිටින මහලු අයෙකු පිළිබඳ**

මහ මඟ වැතිර සිටිනා වගේ
උවදුරු ගලා විත් දෙපා මුලට
මේ කෲර සමාජයේ අයගෙන්
කිසිදු හවිහරණක් නොමැති
කාගේ පිහිටක් නොමැති
අනුන්ගේ ග්‍රහණයට ලක් වුණි
දුටුවෙකු මා
එලෙස සිටිනා වාගේ
පිහිටක් සරණක් පතමින් ඒ මේ අත බලමින්
ඇත ඔහු කිලිටිව එලෙස
සංවේදනීය වුණි ඉතා බොහෝ
දෑස තෙමා වැටුණි කඳුළු කැට මහ හයියෙන්
පිහිට වුණි ඔවුනට
පරිත්‍යාගය උතුම්ම මිනිසුන් අගයන
එලෙස පිහිට වුණි බොහෝ දෙයින්
මෙලෙස දුක සිත හඳුනනා නරයින්
ඔහු තුළ ඇත්තේ සහකම්පනයේ සේයාව
බව නොරහසකි...

**ඩබ්.එච්. චමිදු ප්‍රභාත්**
12 **ශ්‍රේණිය**
**ර/රත්මලවින්න මධ්‍ය මහා විද්‍යාලය**

කරුණාවන්ත හදවත්
දිනයි දවසක ලොවෙහි කොතැනත්
අනෙකාගේ දුක දන්නන්
පිපෙන මල් වගෙ සුවඳ පතුරන්

අඟ හිඟකම් ඇතත්
ඇහැකි නම් වෙන්න පිහිටක්
අහර නැති මිනිසුන්
රටෙහි වෙසෙතී ඕන තරමක්

අන්කෙනෙකුන්ගේ ප්‍රශ්නත්
තමන්ගේ ලෙස ඇසිය හැකිනම්
දීමෙන් ඔවුන් හට ඔවදන්
ඔබට විය හැක අවැසි පහනක්

පොත පතත් දැන් මිල වැඩී
නමුත් පාසල් වැඩ ඇතී
අරන් දෙන්නට පොහොසැතී
පුංචි ළමො හරි තුටු වෙතී

ඉපදුණොත් වයසට යතී
නොහැකි වේ එය නැවත ගත හැකී
වයස කෙනෙකුන් දුටු සැටී
උදව් කරමු අපි නොපැකිළී

එකතු වුණොතින් යළි අපී
කළ නොහැක්කක් නැත මෙහී
අනුන් දුක දැන හඳුන ගනිමිනී
එතැන "සහකම්පනය" යළි ගොඩ නගී
අනෙකාගේ දුක දැනගෙන
සහකම්පනයකින් යුක්තව
වැඩ කළොතින් හැමවිට
නෙළා ගත හැක එක මලක් නොව,
මල් සියක් වුව...!!

ඩී.ජී.භාග්‍යා නෙත්මිණී ගොඩගම්පල

මිනිසත් බවට අප හැම දින ගරු කරමු
පව පින දෙක හඳුනා ගෙන දිවි ගෙවමු
කෙනෙකුගෙ දුකට හැම විටකදි කන් යොමමු
ඒ හැම විටකදි අප කළ හැකි දේ කරමු

දුක හා සතුට අප සැමටම උරුම වෙති
එය විඳ ගන්න සැම දෙනාටම සිදුවේවි
පිහිටක් අවැසි අය ඒ අතරේ සිටිති
ඒ හැම විටම පිහිටක් වීමත් පිනකි

කෙනෙකුගේ හදවතේ ඇති කාරුණ්‍ය ගුණය
සැම දෙන අතර පතුරා ලීමට හැකිය
දයා ගුණය හැමවිට ඇති කළ යුතුය
එයින් දිවිය මෙත් මගකට ගත හැකිය

මිනිසුන් අතර ඇති දුර්ගුණ නැති වේවා
උස් මිටි පහත්කම් ඇත්නම් දුරු වේවා
සැමදෙන සමගියෙන් එක පවුලක් වේවා
සැමදා යහපතින් මේ ලොව බැබලේවා

සහකම්පනය හැම හද තුළ ඇති වේවා
එය දැනෙන හැමට එය පිහිටක් වේවා
කරනා සියලු දේ යහපත් දෙය වේවා
සැමගේ දිවි ගමන නිවනින් සැනසේවා

**යූ. ජී. එස්. ඩී. මුතුකුමාරණ**

සිව්පාවෙකුට වුවත්
දැනෙයි දුක් වේදනා
නමුත් පවසන්නට
නොහැකියි
කතා කරනට බැරි වූ නිසා...
කතා කරන්නට හැකි නම්
කියයි මට කුසගිනියි කියා
මට ද වේදනා දැනෙයි කියා

පා සතරක් තිබුණත්
ඇවිදීමට ඇත්තේ
පාද තුනකි දැන් මට
දෙවිවරු වන් මිනිසුන්
ඉන්නා ලෝකයේ...
නොමිනිසුන් ද සිටි
අන් අයගේ
වේදනා නොදැනෙන

එවැනි අයෙකු නිසා
අහිමිවුණා පාදයක්
මා හට...
දැනුණා වේදනා
ඉවසන්නට බැරි තරමක්

නොමිනිසුන් අතරින්
දෙවිවරු වන් මිනිසුන්
සුව කරා මාගේ පාදය
නොහැකියි ස්තූති කරනට
කතා කරන්නට බැරි නිසා...

උපදිනා හැම භවයකම
පතන්නම් ඔබ සැම හට මා
නීරෝගී දිවියක් ලැබෙන්නට කියා...
සිවුපාවෙකු වුවත් මා
මාගේ වේදනා තේරුම්
ගත් නිසා...

**එම්. තිලිණි මධුවන්ති**

# සහකම්පනය

2023 ඔක්තෝම්බර් කලාපය



Volume Two - © 2023 Department of education Sabaragamuwa

# I FEEL YOU............

The greater joy that you feel

I can imagine how you feel

The greater pain that you feel

How wonder, it also I feel

I can care

I can share

No matter what it is

Rather than yours, mine that is

I feel............

I feel...........

**Lithula Dissanayake**
**Grade 7A**
**St. Mary's College**
**Kegalle**

# ඇදුරු සිතිවිල්ල

-----------------------------

**පය සිඹින ගල් බොරලු**
**පිට එළලු සුදු ඇඳුම**
**පොත් වැටුණු බහාලුම**
**නුඹට හිමි මුත් පුතේ ...**

**ඇතමුන්ගෙ සමච්චල්**
**ලොකු උන්ගෙ බල රැවුම්**
**කුස සැනසූ ඉඳුල් බත්**
**උරුම වූ මුත් පුතේ ...**

**එපා නුඹ සැලෙන්නට**
**සිත් පුංච දැඩි කරන්**
**සියලු දේ සිත දරන්**
**අකුරු කරපන් පුතේ ...**

**හිදිමි නුඹ පසුපසින්**
**මුවග රැඳි සිනා කැන්**
**සමග නුඹ දකින්නට**
**නුඹේ ඇඳුරිදු පුතේ ..**

ආචාරිනී
ඩබ්ලිව් .අයි. පද්මිණි
කෑ/කෑගලු බාලිකා විද්‍යාලය

# ඔබ එනතුරු තනියම මම ඉන්නම් අම්මේ මඟ බල බල..

මගේ කුසගිනි නිවාලන්ට
මස් කටු අර ගන්නට ගොස්
ආයෙ නැවත නොයෙන ලෙසට
මං මඟ ඇයි සැඟව ගියේ..

ලොකු නෝනලා ඇවිත් අනේ
දමයි පාන් රොඩු මගෙ ළඟ
බඩගින්නට කිරි නැති මට
එය රජ බොජුනකි අම්මේ...

කකුල් තුනට වාරු දිදී
හෙමින් හෙමින් ඇවිදින කොට
ලොකු අයියලා අක්කලා මට
කැතයි කියා සිනාසෙනවා...

අංගවිකල මගෙ තනියට
ඔබ සිටියා අප්පා නැතත්
කිරි නැති නුඹෙ ළය තුරුලේ
ඉන්නට ආසයි අම්මේ...

අනිත් ළමයි අම්මා එක්ක
තුරුල් වෙනවා හාදු දෙමින්
ටකරම යට මම තනියම
ඔබෙ සුව සොයනවා අම්මේ...

වැහි පොද මට පෙරළි පෙරළි
ගසමින් යයි සිනාසෙමින්
උණුහුම නැති සීතල මට
ලොකු මන්දිර මට එපා අම්මේ...

ඔබ එනතුරු
තනියම මම
ඉන්නම් අම්මේ
මඟ බල බල...

**ඒ.ආර්.ජී.සී.කේ. ජයසුන්දර**



Volume Two - © 2023 Department of education Sabaragamuwa

මහමගදී කම්පා වූ හද....

වැඩපළ හමාරව
නිවෙස්නට යන කල
දුටිමි කුඩා බබෙක්
යන්තමින් දෑස් හැරිතව
කිරි සුවඳ නොදැනුණි මුවින්
මව් ඇකයෙන් වෙන් කෙරුණිද
උපන් ඇසිල්ලෙහිම නර දෑතකින්..

වික්ටෝරියාහි වාන් දොරටු හැරි සේ
දෙකොපුල් පුරා ගලන කඳුළුය..
ආතුරයෙකුගේ සන්නිපාත කය සේ
හිරිකඩට පෙඟුණු වතය..
මුව පොඩිය විදහා හඬනයුරු
සිහිගන්වයි
ම කුලුඳුල් පුතුගේ ජන්ම දිනය..

ගනිමි තුරුලට
වැළඳ ගමි තදින්
මව් නැති අඩුව සපුරමි
"ලැසී...."
නුඹ දැන්
සුරතලෙකු නොව
රැකවලෙකුද නොව
මගේම දරුවෙකි....

එම්.එම්. දිලිනි රංගිකා මාපා

# පුවතක්

**දිනපතාම තම බත්පත පන්තියේ සිසුවියකට පරිත්‍යාග කරන ගුරු මවක පිළිබඳ වාර්තා වේ.**

## ගුරු මවකගේ සිතින්

සුදෝ සුදුවට දිලිහෙනා සුවඳින් පිරුණු පොත් පිටුවක
සමර පැහැයෙන් සිත්තරෙකු ඇඳි සිතුවමක් සේ ඔබ දැක
කිමද කලලෙහි පැහැය ගවුමේ නොඅසාම නොම කර සැක
පන්තියේ ගුරුතුමිය වෙමි මම බෙදන සෙනෙහස දාරක

විවේකයෙ සීනුව දෙසවනට වියවුලක් සේ ඇසුණද
නේක රසමසවුළු සුගන්ධය නැහැ තුඩග සිප ගත්තද
පතුළ දිලිහෙන කෑම පෙට්ටිය නුඹට ඔච්චම් කෙරුවද
කරාමයෙ සීතල වතුර බිඳු අමෘතය වී දැනුණද

කුසේ ගින්දර පුළිඟු නොතකා හිතේ ළැව්ගිනි ඇවිළුණේ
මගේ බත්පත ඒ ඇසිල්ලෙක නුඹේ සුරතේ දැවටුණේ
දෑස් මිණිකැට ඔප වැටී දිලිහෙනා යුරු දැක තුටුවුණේ
සසර සාගිනි නොම දැනේවා පැතුම මුවගින් මිමිනුනේ

එම්.එම්. දිලිනි රංගිකා මාපා



# අසරණයි නුඹ මෙන් මමත්

විද අයිනේ ඉකිලමින් හුන්
නැගණියක් තනි වී
ළංව බැලුවෙමි පා නගා මා
මගේ වයසමදෝ ඈ දෙවියනී
කන්න නැතිදෝ බඩගිනියිදෝ
යමුද නංගී ඇසුවෙමි
ඇසුව ගොංකම මම මටම
දෙස් තියාගත්තා බුදු හිමියනී
තේරුණා වැඩි වැඩියෙනුත් මට
දිගයේ ඇද නංගියේ

පහේ සමතෙක් වූව හින්දා
රෑ එදවස
කතරගම හර සංතොසින්
අරන් දුන්නා දොදොල් මස්කට්
ඉල්ලුවා මං අම්මගෙන්
බාරෙකුත් විලාලු තාත්තා
මගෙ දෝණි රැක ගනු ලෙසින්
දෙන්නටම හිටි පළමු මැණිකයි
ඊච මම හිටියාට දැන්
අසරණ ලෙසින්

කණකොකා ආවෙ අපේ ගෙදරට
සාත්තර ගැහැණිය ලෙසින්
වයස විස්සක් ගෙවිල යනකන්
අපලයිලු මගෙ අම්මට මගෙන්
තරුණ වයසත් ඇවිත් හින්දා
යන්නලූ දිගෙක මටත්
දැකලා නෑ මං ඇස් දෙකට ඒ
මනාලයා ලොකු මහත්තෙක්
අනිද්දට ඒ දිගෙ කෙරෙනවා
මට යන්න බෑ ඒ ගමන්
ආවා මම සොයන් යන්නට
මේ දුක නිවා ගන්නට තැනක්
ඉතින් අක්කේ නෑ අඬන්නේ
අම්මලා මතකෙට ආවොත් මිසක්

අම්මලා මතකෙට ආවොත් මිසක්
මටත් එන් නෑ කඳුළු නම්
අසරණයි මං උඹට වැඩියෙන්
අම්මා දුර මට ගව් ගණන්
කොහොම සනසනු නංගියේ නුඹ
අසරණයි නුඹ මෙන් මමත්
හැරිල යං නංගියේ ඔහොමම
අම්මා ඇර නැහැ කවුරුවත්
දෙන්න නෑ උපදෙසයක් මට
ඒ ඇරෙන්නට තව යමක්

අහන් ඉන්නම් දුක උඹේ මං
මටත් තියනවා ලොකු හිතක්
දිග විත් තනි වෙච්චි මට නම්
දැනෙනවා නුඹ දුක මහමෙරක්

**ආර්.ඒ.ඩී.අයි. රූපසිංහ**
**ර/ඇඹි/ පනාමුර මහා විද්‍යාලය**





සහකම්පනය

# YOU'RE NOT ALONE

oh there's a servant girl
who is wearing a dirty frock
who is sharing only tears
who is doing everything
in this palace
I felt it
because
oh i'm a newly married girl
who is wearing old ones
who is smiling by hiding sad
who is thinking everything is a mist
I felt it
because
there's no difference between
little girl and me
we have
no script
no independent
no shelter from own mom,dad
I felt it, felt it,felt it
wanna share your sorrow little girl!
there's no right way to do it
simply listening
simply connecting
communicating that
incredibly healing
message "you're not alone"




**R.A.D.I. Rupasinghe**
**ICT Teacher**
**R/Emb/Panamura MV**




Volume Two - © 2023 Department of education Sabaragamuwa

# පතොක් මලක්

පවුලේ ජීවිත රකින්න
වැලි කතරක පෑයු සඳ
ජීවිතයේ යොවුන් සමය
දිය වෙනවා ඉර අව්වට

දිවා රැයේ වැඩ කෙරුවට
දැනෙන වෙහෙස නිවාලන්න
වලාකුළේ වැස්ස අරන්
දැන් වැහැපන් වැලි කතරට

දුර කතරේ හුදකලාව
ඇගේ හිතෙන් මකාලන්න
පෙම් ගීයක් වෙලා ඇවිත්
සුළගේ ඇගෙ ගත වැදෙන්න

රටටම ණය නැති තරුණිය
මහලු වෙලා තනි වූ විට
හිතට දැනෙන පාළු ගතිය
සුළගක් වී නිවාලන්න

කාත් කවුරුවත් නැතිවම
තනිවුනු ඇගෙ මළකඳ වෙත
අවසන් බුහුමන පුදන්න
සුළගේ ඔබ ඇවිත් යන්න

ජීවිතයේ කටුක බවින්
මේ භවයේ අත් මිදෙන්න
පතොක් මලක් වී පිපියන්
මල් අසුනක පරව යන්න.

එච්.ඩී.ජී.එම්. පියුශානි විජේරත්න.

# සහානු කම්පාව.

රුක්ස ගස් වල සැදෙනා එල මෙන්
කුඩා වුවත් මිනිසුන්ගේ හදවත
අමෘත රස දෙයි අනුන්ගෙ දුක දැක
කෙබඳු ලෙස වුවත් උන්ගේ පැවතුම

සැඩොල් කුලේ ඉපදුණ සුනීතයන්
එදවස රජ කල අජසත් කුමරු
නැත කිසි වෙනසක් සැමටම එක ලෙස
පිහිට උනේ අපෙ සම්බුදු සමිදුන්

විපතට පත් වූ අසරණ යන් හට
කිසිදා නැත්තේ පිටුපා යන්නේ
තමන්ට හැකි ලෙස පිහිටක් වන්නය
සම්බුදු සමිදුන් පෙන්වා දුන්නේ

අනුන්ගෙ දුක දැක පිහිට නොවන්නන්
කිසිදා නැත ලොව හදුනා ගන්නේ
සැබැවින් ඔවුනට මතුවට වෙන දේ
කිසිදා නැත පැහැදිලි ව පෙනෙන්නේ

ඔවුන්ගෙ හදවත් නියගල මල සේ
විෂමයි සැමවිට පතුරා ලන්නේ
ගිනිදැල් වන් පව් කරනා සැම හට
කිසිදා නැත සද සිසිල දැනෙන්නේ

එනමුදු අනුන්ගෙ දුක හදුනා ගත්
උගතුන් ලෝකයෙ මිණිකැට වැන්නේ
සතෙකු වුවත් නැත හිරිහැර ඔවුනට
මතුවට පින්කම් කරවා ගන්නේ

එච්.පී.පී.සී. කුමාරි


Volume Two - © 2023 Department of education Sabaragamuwa

## රෑට හඬන බට්ටිච්චි

ඉදිවැට ට දැඹු දමා පිය නගන අප්පච්චි
කඩන්නට නැතිලු දළු කියා ගෙට ගොඩ වෙච්චි
රෑ තිස්සේ හඬ නැගුවේ වරිච්චියේ බට්ටිච්චි
ඉටි කොළය උඩ ගිහි තෙමුනා ගෙයි මැද බිත්ති .

මැටි ගුලිය එකින් එක දියවෙලා ගැවෙච්චි
බුර බුරා නැගි දැල්ල තෙමී දර අළුවෙච්චි
කැඳ නැතුව හාමතේ අඬනවා අපෙ හිච්චි
හදවතේ ගිනිදැල්ල නිව්වෙ හිරු එලිවෙච්චි.

මිරිවැටි ය බර වැඩි තෙත බරිත වෙච්චි
දුම් ගඳට සුදු ගවුමෙ මුහුණු හැකිලිච්චි
රතු බතට අද අම්මා තැලුවේ රතු කොච්චි
මුතු ඇටය ගැලවෙයිද කඳුලු බර වෙච්චි .

පැන්සලත් පාවුනේ මහ රෑම වැස්සේ
පොත ඉරා හැදුවෙ මං ඔරුව රෑ තිස්සේ
ගුලි වුනේ අපි සැවොම කැඩුනු කොහු මෙට්ටෙ
කඳුලු වැස්සට ඊයේ තෙමුනා මගෙ කොට්ටේ.

බල බලා අහස දෙස සඳට කවි ලියන
තරු රැසකි මහ පොළොවේ උණු කඳුලු හෙලන
ලුණු රසය හැම දිනම දෙතොලග ට වැටෙන
තැඹු මතට පැණි රසය ගෙනෙන දින කෙදින....

ඒ.එම්.එස්. අත්තනායක
ර/හිදුරංගල විද්‍යාලය කිරිඇල්ල ..

## සැගව ගිය මවු සුවඳ

සිනා මුව පිර කමල
රැදුනු ,පන්ති කාමරය තුළ
මලානික වූ වතක්
දුටිමි මා එක් දිනක්

රැගෙන මගෙ සාර පොට
දමා ඇගෙ හිස මතට
ළං ළංව පියවරෙන්
සිඹින වග දැනුනි නුඹ

අනෝරා වැසි වැටුනු
සුමානයෙ පසු ගෙවුනු
ගං දෑල තුළ සැගව
ගියේ ආදර මෑණි

නොගිය මුත් කිරි සුවද
ඔය පුංචි මුව මඩලෙ
දෙන්න හැකි වේද මට
ඉගිල ගිය මව් සෙනෙහෙ.

එම්.එම්. ධම්මිකා කුමාර සෝමරත්න.


Volume Two - © 2023 Department of education Sabaragamuwa

## කුසගින්නට මිළිනව  ගිය මල් කැකුළ

ගෙදර බුදුන් වු "අම්මෙක් "කල වරදින්
වන්දි ගෙව්වෙ මල් කැකුළක් අකාලයෙන්
ගුටි බැට දුන්නෙ අමු තිරිසන් බාප්පගෙන්
හේතුව අසන් දෙවියනි ඇයි නිහඬ බවින් ?

ගෙදරට ගෙනා පැණි වළල්ල දුව කෑවා
තිරිසන් සතාගෙන් ඇය හොදහැටි ගුටි කෑවා
මුසල රැයේ අවසන් හුස්මත් හෙලුවා
"අම්මේ" හදවතට දුක් නොදැනුනිද දවා ?

අපි සැර වෙන්නෙ පොඩි උන්  අපෙ නොකන නිසා
"දෝණි" මැරුණෙ කුසගින්නට කෑව නිසා
අකල් මරණයක් ලැබුවේ පෙර පවක් නිසා
මතුමතුත් නොම වෙයන් දුක මේ සසර නිසා

සමන් දෙවිදුනේ ඔබ සිටියේ කොහිද
අහිංසකාවිය ඔබ හට නොපෙනුනිද
පතල් වළක සැඟවුයේ රැකුමටද
යළි මතු කලේ දඬුවම් දෙනු රිසියෙන්ද

අපරාධය නුහුලයි අහසත් පොළවත්
නියමිත තීන්දුව දෙයිදෝ නීතියවත්
නීතියේ රැහැන්පට බුරුල්ව ලිහී ගියත්
සොබාදහම දෙයි දඬුවම්  කවුරු නැතත්

කුණු වී ගිය කැකුළ සිටියලු අසරණව
ගෝනිය ඇතුලෙ ගල් ගෙඩි තුනකුත් ඇතිව
ඇදසිටි කුඩා රෙදි කැබලිති වෙන් වෙන්ව
බලා හිටිය උන් හැදුවා හද බරව

රැකගනු නාමය අම්මෙක් විලස හර ......
හැසිරෙමු කුඩා පැටවුන් අසරණ නොකර ......
පැටවා වැටුණ  විට ලෙහෙනිය ඉසිළු බර......
අමතක උනා නම් කළ යලි මතක් කර .......

ජේ.කේ.ඩබ්.එල්. ජයවීර

## දියදම් වලප

රසුදුළ
නදී තෙර
ඉදුවර
සුනිල දිය

රොනවුල්
වැතිර නෙක
සොබමන් පා
රගන

නුබ සැවි
දිවෙනදයුරු
අමයුරු
කොමල වත

දියදම්
නාරි හැඩ
සිරිකත
මන බඳින

නමුදු
රැදුරු නර
රිසි ලෙස
ඇද නසන

නිලඹර
දිගු වරල
තුරු අත්
සිඳලමින

තඹර නෙතු
ඔත්පලව
හඬමින්
පණ අදින

මිහිමව්
සෙනේ
නොවටිනු
දුදනනි කිමද

ශ්වේතා තාමරසී ගලබඩ මැණිකේ



දරුවනේ නුඹ මගේමයි
මව පියා නුඹේ මං තමයි
දෙතනෙ කිරි බිඳු නෑ තමයි
එත් රුහි බිඳු කෑ ගසයි.......
නුඹේ පිපාසා කුසගිනි
මට දැනේ හද ගැඹුරෙනී
නුඹට නැත්තම් මටත් කුමටද
රස බොජුන් මගෙ දරුවනී.......
මගේ බත් පත නුඹට දී
නුඹේ සිනහවන් දකිද්දී
මගේ රුහි බිඳු කිරට හැරිලා
නුඹ නමින් සෙනෙහස දිදී.........
සිප් කිරෙන් නුඹ තනාලා
නුඹ වැඩෙන හැටි බලාලා
මගෙම දරුවන් නොවුණු නුඹ හට
මවක් වී මා සැනසුනා...................

**ඩබ්.වයි. සුභානි නිරූපමා ප්‍රේමතිලක**



# මිනිසත් භවය

විය සිදුරකින්
බලමින් අහස
දස මසක් කුසෙහි හිද
ලබා ගත් මිනිසත් භවය

වැටි වැටී නැගිටිමින්
දෙපා පොඩි ඔසවමික්
හඬනගා හිනැහෙමින්
ලබා ගත් රූප කය

මොලොක් ගති සඟවාන
දුදන ගති රඟපාන
තවෙකු පස හඹායන
මොට ද මේ ජීවිතය

කෙටියි මේ භව ගමන
යන්න වෙන මග නොදැන
දිනක් එයි සිත නිවන
හදවතට හද දැනුන

හඬන විට තව එකෙක්
ලඟින් ඉමු දුක බෙදා
සිනා නගනා කලදි
සිනා සෙමු සෙත සදා........

ඊ.පී. ගයනි ලසන්තා කුමාරි

# Read Me

I would love to share my experience although it is so emotional.

I love to be with my friends. We always talk together, work together, laugh together and cooperate.

But, one day, seeing my friend Thisara staying alone in the corner of the classroom my voice arose,

**“Hey Thisara, what are you doing there?**

**Come on, Join us”**

He did not utter any word, instead, he kept his head on the table.

**“Oh! Dear, why? What happened?”** I asked.

No words came from him. I and all my other friends were curious to know what had happened.

I went close to him.

**“Oh! No. You are crying”** all at once, those words came out of my mouth when I saw the drops of tears, flowing along his cheeks.

**“Yosh……..er er…..my mother………..”** he hugged me saying like that in a crying voice.

“Why? You seem to be so sad. Tell me Why?

**” “She has got cancer”**

With that sad news, I got shocked. I forgot where I was. I could not bear it. My eyes also welled up with tears.

**“How can my friend bear up all these?”** I thought.

I have never seen my friend, Thisara suffering like this. I was really worried. I determined to be a strength to him. As I could understand his feelings, leaving footprints of love and kindness made my friend a part of my life.



**Done By: P.B.M.Y.K. Basnayake**
**School: St. Mary's College, Kegalle Grade: 10**

# පෙම් උරුම

කොඳ කැකුළු මිලිනවී
තඹුරු මුකුලිත වෙවී
ඉකිබිඳින සයුරු ඉම
තිබුදා පෙම් බැඳී
කලුකුමාරයන් වුයේ
කිමද දෙව්ද කුමරියට
ළපටි සිත විසුරවා
හීන මල් පොකුරු දී
රාග ගිනි අවුළුවා
හීන බින්දේ මන්ද

කිරි සිනා මුව සුවද
කෙලෙස් නතු වුයේද
කාමතුර සල්ලාල
වීරයා වුයේද
මවගේ තුරුලේ සිටිය
කිරිකැටිය කෝ කොහිද
පියතුමාගේ ඇසුර
දුරවුනේ ඇයි මන්ද
නෙත් පැලෙන කදුළු බිදු
ඇසට බර වුයේද

පේන රූපය නොවේ
තෙපලන්නෙ මුසාවේ
විසගෝර නරුමයන්
සිටී වටපිටාවේ
වැටුන බාදුරාවේ
ගොඩඒම පමාවේ
දෙන්නෙපා දෙස් දෙවොල්
කෙල්ල අද අනාථේ
අප්පා නැති දූ පුතුන්
ලොව දකින වෙලාවේ
සෙනෙහසේ අත දෙමුද
නොවී මං මුලාවේ

දරාගන්න දිරිගන්න
කදුළු ගිනි සඟවන්න
මේ ලෝකෙ දැකගන්න
කිරි මුවට ඉඩදෙන්න

**ඩබ්. ඒ. ශිරෝමි වීරක්කොඩි**
**සිංහල අංශය**
**කෑ/දෙහි/ගෝනගල ම .වි .**
**ගෝනගල**

# නොතැවෙන් දියණියනි...

වැඩි ලකුණු ගත්තාට
නැත දුටුවේ සිනහවක්
බර කල්පනා ලොවක
සිත නතර වී ඇති හැඩක්

මව නොමැති දා සිටම
බොහෝ දුක් ගැහැට වින්දාට
නොතැවෙන් දියණියනි
රළු වූ අතැඟිලිවලින්
ලිවිය හැක මෘදු වචන

කිරි කහට ඇති ගවුම
ඇන්දාට හැමදාම
වැරදුනේ නැත අකුරු
නුඹේ ඔය දැඩි සිතට

ඉදහිටක නෙත් අගින්
ඇද හැලෙන කඳුලු බිදු
නොදුටුවා නොව දියණි
නුඹ දකින හැම වරම
ඔබේ දුක් වේදනා
එලෙසින්ම මා හදට
මහා බරකින් දැනුණි.

**මුදිත රුබසිංහ**
**ර /ඇඹි / කුඹුරුගමුව මහා විද්‍යාලය**

# වැහි බින්දු බර වැඩියි

හිම්දිරියේ තද සීතලට
අවදිව හාමත්ව
ඇවිදගෙන පාසලට
එන පුංචි කැකුළකට
නොවැටියන් වැහි බින්දු

වෙවුලන අතින් දිග හැරණු
පෙගුණු පොතෙ නැත කරුණු
කුමට දෙන්නට දඬුවම් සිතණු
මටත් වැටුනේ ඒ වැහි බින්දුමයි දරුණු

කරෙහි ඇති මහ බරට
දෙදණ පණ නැත පුතුට
ගෙදර යන්නට මත්තෙන්
නොවැටියන් මහ වැස්ස
වැහි බින්දු බර වැඩියි
කුසගින්නෙ යන නුඹට.........

**මුදිත රුබසිංහ**
**ර/ඇඹි / කුඹුරුගමුව මහා විද්‍යාලය**


Volume Two - © 2023 Department of education Sabaragamuwa



# හදවත විඩාබර වී ඇත නුඹේ නමින්...
## (සුවහසක් දියණිවරුන්ට...ආදරෙන්...)

*නිමිත්ත..මෑත කාලයේ සිදු වූ මහ පොළොව නුහුලන අපරාධ..දියණිවරුන් තලා පෙළා දැමූ නරුම සිත් ඇත්තන්ට සොබාදහම දඬුවම් දෙනු ඇත..*

රජමැදුරක පැල්පත ළඟ මැටි ගෙයක...
නිනව්වක් නැතිව රැව් දුන් නුඹේ දුක...
දෙසවන් පුරා තවමත් ඇත පිරුණු හඬ...
එහෙයින් ඔබේ නම අමතක කරමි මම..

යාපනයේ තල් ගස් පෙළ නිහඬ වුණා...
ළමැදේ මිලින වුණු හීනය පෙර දිනක..
සුදු ගවුමක රැලි සේරම විසුණු වුණා...
දියණිය උහුලගත්තේ කෙලෙසක ද දුක...

තවමත් මොළකැටිය සුරතල් බස් දෙඩුව..
සේයා වකුදු නොතබා දුර ඇත ගිය..
යන්තම් කිරි සිනහා පමණයි තිබුණෙ මුව..
හිතා මතා නුඹ අමතක කරමි මම...

ජාතිය වෙනස් ඇති  මුත් පටු අදහසට..
කඩයට ගිය නුඹත් මඩවළ තුළ සැඟව
පාපතරයෙකුගෙ දඬු අත් පාවල සිර ව..
ගිය නුඹ නිතර හුරනවා මගෙ පපුව...

මලක් වගේ දියණිවරුන් වැදු අම්මා..
නෙත් දෙක වගේ තම ළෙහි හොවමින් රැක්කා...
දුවක වෙච්ච වරදක් කොහිවත් නැතුවා..
සලෙලුන් මත්ව  මේ ලස්සන  මල්  තැලුවා..

නුඹ වැනි දියණිවරු ඇත මගෙ ඇස් මානේ..
සමහර දිනෙක මගෙ නෙතු කඳුළින් බර වේ...
ඉපදුණු දා පටන් උහුලන දුක බෝ වේ...
ආදර දියණිවරු තනි නොකරමු ආයේ...

**ඩබ්.ඒ. කල්පනී වීරකෝන්**
**ජේසු බිළිඳාගේ කන්‍යාරාම ජාතික පාසල**

*හදිසියේ පන්තියට ආවා*
*ජයම්පතිගේ තාත්තා*
*අලුත් කොපි පොත් දෙකක් ගෙනවිත්*
*පරණ පොත්ගොඩ මැද්දෙ තිබ්බා*

*ඊයේ පන්තියෙ වැඩ කරනකොට*
*පොතක් තිබ්බේ නැතිය කිව්වා*
*දුක හිතෙන එක නවත්තන්නට*
*ටීචර් පොතකුත් දුන්නා කිව්වා*

*රබර් කට්ටියේ කිරි එකතු කර*
*මගට ගෙනවිත් වහලා තිබ්බා..*
*පොතක් ඕනෑ කියලා කොල්ලා*
*ඊයේ රෑ හීනෙනුත් කිව්වා..*

*අඩු නොකර මගෙ පුතා බැලුවට*
*ටීචටත් පින් කියලා වැන්දා..*
*මගේ ලේ මස් නහර උණුකර*
*ඇස් කෙවෙණි ළඟ කඳුළු රැඳුණා...*

*ඈත දුරකට හිතත් දුවලා*
*ඔහේ හිස්බැල්මෙන් ම උන්නා..*
*තාත්තෙක් මේ වගේ දැක්ක ම...*
*මතක් වෙන්නෙ ම "මගෙ තාත්තා ""*

**ඩබ්.ඒ.   කල්පනී වීරකෝන්**
**ජේසු බිළිඳාගේ කන්‍යාරාම ජාතික පාසල**



Volume Two - © 2023 Department of education Sabaragamuwa

# සහකම්පනය

ළා හිරු මඬල වන්නිය බිම් සිඹින          උදේ
බිඟු කැළ තිඹිරි මල් රොන් සුව විඳින          උදේ
නුබ තල මතින් විහඟුන් ගී ගයන          උදේ
තඹරු මලකි ඇය වැව් දිය පිපුණ          උදේ

කටුමැටි පැලෙන් ගුරුගෙට එන පොඩි          උන්ට
ඇය එක මවයි දුක සැප දෙක විඳ          ගන්ට
බොර පැහැ පිටු මැදින් ලෝකය දැක          ගන්ට
ඇය මව උණා අන්දර ගම් දරු          වන්ට

සත්තම කතාවක් ඇත මට          පසන්ට
මං හෝඩියේ වගෙ මතකයි          හීනියට
අප්පච්චි නැතිව තනිවුණු දිනේ          සිට
ඇය පිළිසරණ වුණ හැටි මතකයි          අපට

අන්දිරි මාමාගේ ඇස් අඳ පොඩි          සිසිර
ඇගෙ අත් අල්ලමින් යයි පාසල්          නිතර
අකුරෙන් ඔහුගෙ නෙත් ඇඳ ඇත          පුබුදුකර
වැහි හිඟ බිමට ඇය වැස්සකි          නිරන්තර

දුප්පත් ගැමි හිතක මුදු මල්          පුදින්නට
දුප්පත් පඩිය ඇය දුන්නේ          ගම්මුන්ට
සිඳ බිඳ දුක් කඳුලු දිවියම          ජයගන්ට
කරුණා ගීයක්ය ඇය මෙහි          මිනිසුන්ට

මිනිසුන් සතුන් යැයි වෙනසක් නැත          ඇයට
ඇය දැක තණි අලිත් නවතී          සෙනෙහසට
වෙඬරු පිඬක් මෙන් උණුවෙණ          හදවතට
වන්නි දෙවියනුත් පරදී සිතෙයි          මට

**ආර්.එම්.ඩී.සී. රත්නායක**

අතරමං කල ඒ...
සොඳුරු හදවත...
දරාගත හැකි උනිද පාලුව...
ඒ... කාන්සිය...
සෝ සුසුම් මහ සයුර විය...
සිත් මඬල කළඹ වන...
විඩාබර හැන්දෑවේ....
ඉකිබිදින...හඬ ඇසින...
සක්වල ගලෙන් එපිටට...
සැදෑ සමය....ගතවෙයි...
මගේ... තනියට.... සිතින් පමණක් දුවන....
ඒ.. සොඳුරු ... මතක සිතුවම් පමණක්ම උරුම වූ....

පාලුව, තනිකම, අසරණකම....... ඒ දරු දුක...
දැනෙයි කකියන හදට...
ඇට මිදුළ තුළ නලියන ලේ සමගම මුසුව....

ඉදින්...
මා... අසරණය... හුදකලා ව...
සිරගතව ඇත සිතුවිලි...
කියා ගත නොහැකි වපසරිය තුළ..
නිහඬ වන්නෙමි... අද මෙන්ම මතුවටත්..
සෑම දිනකම...
දැනුන හැඟුමන් ගුලි කොට.....
කඳුලු සමගින්...
මුදාහැරියෙමි...
හිස් අහස් කුස වෙත..

**වැඩිහිටි නිවසෙහි හුදකලා වූ පියෙකුගේ හදවත විනිවිද දුටිමි...**

**එම්.ඒ. රංගන එම්. මුණසිංහ**

# ගුරුපඬුර

රුවන් පහනින් එළිය වුණ - දස දහස් ගණනක් පහන් දැල් වූ
කසුන් සඳ ගුරු ගෙදර අම්මා - පුදමි කුසුමින් සුවඳවත් වූ
සඳුන් අරණකි නඳුන් උයනකි - ඔබේ සෙවණේ අපට දිස් වූ
අදින් පසු ගුරු ගෙදර කුමටද - මවුනි ඔබෙ උණුසුමින් හිස් වූ

අයනු ආයනු පමණක් ද නෑ - අකුරු කර ජීවිතය දුන්න
කියනු බැරි එක කතාවක් ඇත - හිතේ මං රැක ගෙනම උන්න
තුරුළු කර මා බඳ වටා අත - දමා හෙළ පාඩමක් ගන්න
ගුරුතුමිය අත ගගා බැලුවා - ඉනේ ඇති දෙය තදට වෙන්න

පියා නැති දුක නිවන්නයි මව - බේකරියෙ රෑ වැඩට බැස්සේ
උයා දී දිවි පැදුර නැගුමට - ආච්චිත් වැඩ දවස තිස්සේ
තියා ගන්නට බැරිව වේලා - අනෝරා වැහි වහින අස්සේ
කියා දුන්නා කාකි ඇඳුමෙන් - වහන හැටි ඈ විලිය පස්සේ

පුතේ නංගිට දියං කලිසම - අඳින්නට උඹ ඇඳං හිඳින
ගතේ දවටා ගනින් උඹලගෙ - තාත්තගෙ කඩමල්ල පරණ
කැතේ නැතිවම ඇන්ද කලිසම - කොහු ලණුවෙ තද තමයි රිදෙන
හිතේ හංගනු බැරිව දෙඩුවෙමි - කඳුළු රස බී කොපුල් තෙමන

බඳාගෙන මට දුන්න උණුසුම - ගුරුතුමිය මව වුණත් කාගේ
එදා දුන් සවි අදත් හයියක් - පපුව ගැහෙනව තදින් වාගේ
හදා ගෙන ලොකු ඇඳුම් මල්ලක් - පහුවදා දී අතට මාගේ
උදා කෙරුවා හිතේ අභිමන - එයින් වැඩි වුණි ගමනෙ වේගේ

හවස රෑයෙ දැනගත්තෙ ගුරු - මවුනි නුඹහට ඉසිඹු ලන්න
දවස අද මහ සුදානමක් - උළෙල එහි ඉහළින් කරන්න
මවට හැකිවෙද එරුණ කිරි දරු - පෙමට කවදාවත් වරන්න
කුමට ලතවෙමි හන්තානයේ - තටු ලදිමි ගුරුපඬුරු දෙන්න

කුසට ඉඩදී නැතත් පණ දී - සිප්සතර දිවි කෙතට වැපුරූ
සතුට දුක ළඟ නොවී වෙනසක් - උතුම් මව්වත් බවක් පැතිරූ
පිනට පූරුවෙ කප් රුකක් වී - සක් ලොවින් බට කළණ මිතුරූ
නුඹට නුඹ මිස සොඳුරු උපමා - තනන්නට ලොව සමත් කවුරූ

අයුක්තිය ඉදිරියේ නොසැලී - මිලට මුදලට නොකළ සේවා
නිදුක් නිරෝගිමත් වන්නට - සියලු දෙවිඳුන් පිහිට වේවා
බතේ බුලතේ සැපේ අඩුවක් - කිසිම දවසක නොම දැනේවා
නැතේ බාධා ඔබට සැමදා - මවුනි දීඝායුෂ ලැබේවා

ඩබ්ලිව්. ඉන්ද්‍රානි වීරකෝන්
නියෝජ්‍ය විදුහල්පති
පුවක්දෙණිය කනිෂ්ට විද්‍යාලය

# සහකම්පනය

වරදෙදි සමා වුනා
සතුටෙදි සිනා සුනා
ඔබ ගැන මගේ සිතේ
මිහිරක් හටගත්තා
හිතේ තිබුණු හැම කඳුලක
ඔබේ ඒ දුක්ගැනවිල්ල
සිනාසෙන්න බැරිවු විට
කඳුලකි මා හට දැනුනු ...........

ටී.ජී.ටී.ඒ.තෝලංගමුව
9 ශ්‍රේණිය

# පුංචි ජීවිතය

නැගගන්න නැගගන්න
ඉක්මනින් නැගගන්න
මේ පුංචි ඉරටුවට..........
ඉක්මනින් නැගගන්න
අන්න හරි අන්න හරි
ගුවන් ගත වෙමු සැනින්
අනේ මහ සාගරය
තුළට වැටුනා යළිත්
මගේ පුංචි ඇඟිලි තුඩු
වලින් බැහැ රිදවන්න......
කැඩී අත්තටු යුගළ
වෙයි කලක් විදවන්න....
කොහොමහරි තව වරක්
නැගී අල්ලා ගන්න.......
පියඹලා ඈතටම
සැනින් මා හැර ගියත්
මට දුන්න ඒ සතුට
තියේවි බොහෝ කලක්.......

ඒ.ජී.ඩී.ඩී. ගමගේ.




Volume Two - © 2023 Department of education Sabaragamuwa



# සහකම්පනය

පොත දෙසටම යොමු වී කාලය ගතවන්නේ
ටිං ටිං ටිං දවල් විවේකය නද දෙන්නේ
මං සතුටින් අත් දෙක සෝදා පැමිණෙන්නේ
අම්මාගේ කෑම එකේ සුවඳයි එන්නේ

කෑම පෙට්ටි දිග ඇරලා දෙපස බලන්නේ
මගෙ යෙහෙළිය කඳුලු පුරෝ ගෙනයි සිටින්නේ
බඩගිනි වී සිටින බවයි මට වැටහෙන්නේ
එන්න කියා මං ඇය මගෙ ළඟටයි ගන්නේ

තාත්තාට වැඩක් නැතේ ගෙදරයි ඉන්නේ
ඒක නිසා කෑම නැතේ ඇය පවසන්නේ
මගේ කෑම එක මං හරි සතුටින් දුන්නේ
ඇගෙ කුසගිනි නිවෙන කොටයි මගෙ සිත පිරුණේ

**පී.ඩබ්.සී. ශවින්දි සඳමිණි විතාණගේ,**
**4 ශ්‍රේණිය**
**කෑ/දෙහි ප්‍රභාෂ්වර ප්‍රාථමික විදුහල**
**කිතුල්ගල**

# වීදි දරුවෝ

වීදිවල, පොදු ස්ථානවල
තමන්ගේ දුක කියා අයදින
එක් වේලක් කන්නට
අන් අයගේ පිහිට පතන
අප වගේම දරුවන් ඇති ද කොපමණ

පොත පත ඉගෙනීමට ආස කරන
තම දස්කම් සඟවාගෙන
දෙමවුපියන්ට උදවු කරන්නට
තම ළමාවිය කැප කරන
අප වගේම දරුවන් ඇති ද කොපමණ

තම උපන් දිනයට
කේක් කෑල්ලක් හා තෑගි
ආස කළත් ලබන්නට
වාසනාවක් නොමැතිව
අප වගේම දරුවන් ඇති ද කොපමණ

තමන් ආස කරන
ලස්සන ඇඳුම් පැළඳුම් ඇඳගෙන
තමන් ඉදිරියෙන් ගමන් කරන
ළමයින් දැක දුක් වන
අප වගේම දරුවන් ඇති ද කොපමණ

*යස්මින් මිරැන්ඩෝ*
9-C *ශ්‍රේණිය*
*බ/ ශාන්ත ඇග්නස් බාලිකා මහා විද්‍යාලය*
*බලංගොඩ*


Volume Two - © 2023 Department of education Sabaragamuwa



# සුදු මහත්තයා

හිමිදිරි උදෑසන
කුකුලත් අතින් අරගෙන
ගියෙමි මම......... අලුත් සිප්හල වෙත
කිසිවෙක් නැත පෙනෙන්නට
බියක් දැනුනි මට.........
මා පැමිණියේ දඬු මොණරයේ
රථාචාර්යා කීවා සේ.......
වසන ලද එකක්ද........?  මේ සිප්හල
හෝරාව ගතවිය........
දරුවන් සහ ඇඳුරන් පැමිණ ඇත............
මොහොතකින් ඇස ගැටුණු.........
සිප්හල පුරා දුව යන........
කිළිටි ඇඳුම් ඇඳ සිටි.........දරුවා සමග මම
ගියෙමි ඔහුගෙ පන්තියට
වසරකුත් මාස හතරක් ගත වී ඇත...........
නමුත් ඔහු උගත් අකුරක් නැත...........
විමසුවෙමි ගුරුතුමිය...........
"ඔය ළමයා වැඩක් නැත..........."
කීවාය ඇය
සෙනෙහසින් ලගට ගෙන.....
මා විමසූ විට
හීන් හඬින් කොඳුරා......
"මම කැමති අකුරු ලියන්නට"

කැඳවීම් දෙගුරු
සිහි විකල් වූ අම්මා......
අකුරු නොදත් අත්තම්මා
කුසට අහරක් හොයන විනා.....
වෙන කුමක් කරන්නද
රකුසු ඇස් වලට හසුවී.....
මව් පදවිය ලැබූ ඇය
අසීමිත දරු සෙනෙහස
නිසාම ඇයට ඔහු සුදු මහත්තයා

පිපෙන්නට වෙර දරන.........
ඒ මල් කැකුල ගැන
සොයා බැලුවෙමි මම දිනපතා...........
රැකවරණය  දුනිමි මා..........
අනිකුත් සියලු දෑ සමග
පැමිණි පසු මා හමුවට.............
දුන් විට මගේ බත් පත............
භුක්ති විඳින අයුරු බලා එක්ව තිදෙනා.........
සතුටින් පිරුණි මගේ කුස
දෑසේ කඳුළු පිස දා.........
පැතුවාය ඔවුන් මට බුදුබව.........
ගියෙමි මා ඔවුන් නිවසට...........
අතට බරක් අරගෙන.............
කටුමැටි ගැසූ කුඩා නිවහන..........
දුටුවිට.........
පත් වුනෙමි මා දැඩි කම්පනයට
සරණක් නොමැත............
හයක් හතරක් නොදෙන සිටි ඔහු
"අ" යනු "ආ" යනු කියයි මැනවින්......
ලබා ගති ලකුණු     හැට නමයක්.
විභාගයෙන් ශිෂ්‍යත්ව...........
ප්‍රතිශතය අඩු විය  70ට අඩු ලකුණු..........
ඒත් සුදු මහත්තයා......... ගත්
ලකුණු හැට නමය.
මහමෙරකි .............මට

වසර 10ක් ඉක්ම ගොස් ඇත........
අද සුදු මහත්තයා දහවැනි පන්තියේ
මම...... තවත්....... සිතමි
මෙයද...... ?." **සහකම්පනය**"

**බී ඒ. බණ්ඩාර මැණිකේ**
**කෑ/ දැඩි/ කිවුල් පිටිය ප්‍රාථමික විද්‍යාලය**
**ගලපිටමඩ**


Volume Two - © 2023 Department of education Sabaragamuwa

# සහකම්පනය

සිතකින් සිතකට එබී
දකිමු, දුක.... සතුට...
විලසින් මගේ,
සුන්දර වනු ඇත
ලොවම,
ලොවම නොසිතූ ලෙසින්,
සිත් සතන් පුරවා
සොම්නසින්,
ඔබේ මෙන් ම මගේ.



කේ. වී. සඳරුවන් කරුණාරත්න


Volume Two - © 2023 Department of education Sabaragamuwa

දුකකදි   උණුවෙන්න
සතුටෙදි  සැනසෙන්න
වරදේදි වැලකෙන්න
මිනිසුනේ සැරසෙන්නේ

බැරිම තැන දිරි දෙන්න
හැකි ලෙසට අත දෙන්න
නිති සිනා පතුරන්න
නුඹත් මිනිහෙක් වෙන්න

කී නොකී දේ  ඇහෙන
ඇස් කියන දේ දකින
හිනා  වැසු කතා දෙන්න
දැන තේරුම් ගන්න එන්න

මෙමට ඔබ  -  ඔබට මම
අපිට අපි  -  වෙන කවුද
ඉතිං දුක  -  සැප සතුට
බෙදා හදා  -  ගමු හොඳට

වැටෙන කඳුලැලි පිහලා දාලා
සිනා හසරැලි මුවගේ රන්දා
ඉන්න තැන තනි නොදැනි මකලා
අපි අපිට  ඉමු රැඳිලා


12A
**සමාධි ශ්‍රීමා**
**කෑ/ දෙහි/ රුවන්වැල්ල  රාජසිංහ මධ්‍ය විද්‍යාලය**


# ස්ථාන මාරුව

බොහෝ කලකට පසු
දුෂ්කර සේවයෙන්
ස්ථාන මාරුවක් ලදිමි.

සමුදීමේ උත්සවය අතර තුර
න්‍යාය පත්‍රයට පිටින්
කුඩා සිසුවියක්
වේදිකාවට ගොඩවිය.

"සභාවෙන් අවසරයි,
මම මෙතනට පැමිණියේ
කතාවක් කිරීමටයි.
සර් උඹ හරි නරකයි.
ඔයා අපි දාල යනවා......
මම දෙක ශ්‍රේණියේ
මහේෂි"


**පී.එම්.ජී. බණ්ඩාර**
**ගුරු උපදේශක**
සිංහල, නාට්‍ය හා රංගකලාව, බුද්ධ ධර්මය, සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය, පුස්තකාල
**බළන්ගොඩ අධ්‍යාපන කලාපය**






Volume Two - © 2023 Department of education Sabaragamuwa

# Mourning Tears

I just saw
The glittering tears of
Yours – the punished child's,
The day you've forgotten the task.
And failed to hide
The tears of the same warmth
And same weight
In my own eyes
At the end of the day;
Being a motherly teacher……



Y.R.S. Kumari
English Teacher
Kahawatta Central College


Volume Two - © 2023 Department of education Sabaragamuwa

## Empathy

Fell on the ground
a friend of mine.
Tell she is lifted back
up straight
The pain she feels
For the same to me

Tharundi

## I was crying

one day I was
crying in the ground
Thought no one
was there for me at the time.
one called mom
came to give
a helping hand
Who else would it be
without her

R.K. I. Ranawaka
9A
Swaranajayanthi vidyalaya
Kegalle

## Big Alligment

A teacher came one day
Give us a big assignment
two days passed.
no one did it.
She came in the last Period
asked to finish
or you'll be sacked
from school
Had to play big game to
Finish the assignment

KP.W.W.M.U.P.Abhayaratna

## ස්තුතියි මිතුර !

ඇඬුණා මට එක් දිනකදි
තනි වූ විට
සිතුනා මිතුරන් නැති බව එවක මට
පැමිණෙනු ඇත්තේ
එක මිතුරෙකු දෙවියකු ලෙස
ඇඬුණි තවද ඇතිවූ සිතුවිලි මත
නැවත මෙලෙස
නොසිතෙයි දැයි සිතුනි මට
ස්තුතියි මිතුර ඔබෙ ඒ
උණුසුම් හදවතට

ඩබ්.එස්.රොමෙත්

## I can

I'll be helping
as much I can
Tears falling
when our eyes are met
memories in pain
will always be memories
How can a flower fall
when its blooming .

V.M Gurusingha.




## Lovely day

Shed tears on a lovely day
Thought I had no friends.
One god like friend
came to me.

More tears Came down
at the thoughts I wept.
hope things never happen again
became my prayer.
Thank you my dear
for
your pathetic new heart

Swaranaj

**අපි දෙන්නම**
**දුකක් දැනුනු හැමවිටම**
**මනුස්සකම දැනුනා**
**මට සතුට දැනුනු සැමවිටකම**
**සිනාසුනා අපි දෙන්නම**

A.A.G.S.රෝෂන්

## Empathy

Every time sadness was felt
Humanity was felt by me
Every time happiness was felt
We were both laughing

**A.A.G.S.Roshan**

## Who is the best...

Thought I was alone
With no friends anywhere
In came the one who is the best
My mother is the solution.

A.V.B.T. Samarathunga



Volume Two - © 2023 Department of education Sabaragamuwa

# Empathy

No one lives forever
But in the small life Span of ours
We can love others and
be kind as well
We can happy or
Sad for
people's victories and defeats
is simply
Empathy

Have an honest & humble heart
you can always find
someone to be a as honest you

Be happy for their happiness
Be sad for their Sadness

You can always be
kind enough to give them
a small advice

Kindness and love is the only thing
essential to make this toxic world
a better place to live in
We can all be a part
of the healing journey of the world

M.P. Vihara Sadasmi

# සුවඳ දී ඔබ

කරන්නම් උපකාර හැකි පමණින්
මෙමා
ඇස් වලින් කදුලු වැටි නුඹේ නෙත්
යුග බලා
වේදනාවන් රැදුණු මතකය
මතකයක් වී....
තිබෙනු නියතය .
මලක් සේ පරවෙන්නේ
කෙලෙසද ?
සුවඳ දී ඔබ රැඳෙනු මිස ,

වී.එම්.ගුරුසිංහ
ස්වර්ණ ජයන්ති විද්‍යාලය
කෑගල්ල


Volume Two - © 2023 Department of education Sabaragamuwa

දූලාට කැමති නැති නිසා මගෙ          අම්මා
තාත්තට මා දමා ගිහින් නැත          පෙම්මා

කුඩම්මෙක් ගෙට ඇවිත් මට පාලු   හින්දා
ගගේ ගිය කිරි මුට්ටි නොගෙනාවෙ මන්දා

මට මගේ කාමරේ රෑට තනි              හින්දා
තාත්තත් නොඑන්නේ කරුමයද        මන්දා

නිතර මට යාලුවොත් හිනාවෙන       හින්දා
පාසලත් එපා විය සතුට නැති           හන්දා

දොස්තරට පෙන්නලා බෙහෙත් දුන්   හින්දා
උරුමයද ඒක මගෙ ගෙනා මට           නින්දා

මගෙ සිතේ හැගුමන්ට ලංසු නැති    හින්දා
අතින් මම ජනේලයෙ වීදුරුව            බින්දා

රාහුලගෙ තාත්තත් අතැර ගිය          හින්දා
තාත්තගෙ අරමුණත් ඒකමද             මන්දා

මගේ දුක නොහදුනනා හිතක් ඇති     පෙම්මා
බුදු සමිදෙ ! බුදු වෙයිද ? මෙහෙම මගෙ අම්මා

ශිරාණි  වීරරත්න
ස්වර්ණ ජයන්ති විද්‍යාලය

# දිසාපාමොක් ,

අනේ ! සර්..
ලොකු දූවනම් එපා
මන් හොදම ගෝලයා තමයි,
ඒත්, එපා
කඩු ශිල්ප , දුනු ශිල්ප
පාස් විභාග
රස්සාවට ඉස්සර
එපා පරස්ථා....
අම්මත් බනී..

වැද්දට ඇය කඩුව දේවි
උගෙ හීනෙ ඈ හිටියා

"තිබූ තැනක සොරසතුරන් ගතනොහෙනා"
මතු රැකෙනා ශිල්පය කෝ ?

දිබුල් ගහේ නග්ගලා මං ගියා කියා
බනී වි මට කාලකණ්ණියා කියා

බුදු සර්....
සල්ලි ඕනා පවුල් කන්න
නාට්‍යයක් චිත්තරපටියක් බලන්න
සංගීත සාජ්ජයක් දාන්න
එමා වගේ පොතක් ගන්න
ශ්‍රෙගරි වැව වටේ
නෝනත් එක්ක රවුමක් යන්න
හැමදාම නැතත්
සෝඩා ඇතත් නැතත්
යාලුවන්ට එන්න කියන්න.

සාලිය නෙමෙයි මන්
සර්ටත් කෝ දෙන්න දැවැදි
ආදම් හා ඒවා වගේ දැන් බෑ
පොලොවෙන් මතු නොවෙන නිසා
ඇල් හාල් ...

කඩු දුනු ශිල්ප දත්මට
බෑ වෙන්න අගුල්මල්

ගැරිජ් එකක්වත් දාගෙන
දැතේ විරියෙන් නැගිටල
හැකියාවට තැනක් හදන්
මන් එන්නම්

පුලුවන්නම් ඒ එනකොට
හැකියවට රැකියාවක්
රැකියාවට  හැකියාවක්
තෙයෙන විෂය නිර්දේශය

පොඩි එවුන්ට හදා ගන්න

මන් එනකොට දූ හිටියොත්
බැරියැයි ඔය ඕන එකක්...

ශිරාණි  වීරරත්න
ස්වර්ණ ජයන්ති විද්‍යාලය


Volume Two - © 2023 Department of education Sabaragamuwa

## අදත්-හෙටත් දුක් විඳි අම්මලා....



පිරිපුන් සිරුර කෙසඟ ව
දියාරුව දිරනා කර්ම
තන පුඩුවෙන් කිරි ලේ උරා බී
කර-දැඩු උස්මහත් ව පුතුනේ........
කළකම් නිසා
අන්න..... නුඹ සුරතල් සිනා දුටු
නුඹව රජෙක් කරන්නට දුක් වින්ද
නුඹේ අම්මා ම....
ජේලර් පොලිස් මහතුන්ගෙන් නුඹලාගේ
මුහුණු දකින්නට - මරණයට
මොහොතක් කියා, තියා හෝ...
යාතිකා කරනවා.

පුතේ උඹට දැන් සතුටුයි ...........!

**සුභාෂණ ආර්. වඩුගේ**

## පුළුවන් දුරක් යන්නට...

(මහපාරේ අයිනක, අයියා කෙනෙක් මල්ලිට පිරිසියකින් තේ පොවයි)

**මනරම් ය කියා - පෙරුම් පිරුවාය කියා**
**ගෙනා හුස්ම ටික ඉවරවෙන තෙක්ම**
**සමහරුන්ට අහිමියි**
**ජීවිතය......**
**පුළුවන්නම් අපිට ඒ ජීවිතය**
**බෙදාගෙන හදාගෙන**
**පුළුවන් දුරක් යන්නට සිතක් නිවනා**
**අනුහසින් උතුරාවි නිරාමිස - නිවනක සෙනෙහස..**

**සුභාෂණ ආර්. වඩුගේ**



## නොඉඳුල් පුංචි හිත්

(මහ වැස්සක තෙමෙන බල්ලකුට, කුඩයක් ඉහලාගෙන සිටින දරුවෙක්)

දයාබර වර්ෂාවෝ අනේ
පුළුවනි නම් තව පොඩ්ඩක්
අහස් තලයෙන් හෙමින් රෑ රා විත් අඳුරු
අනෝරාවත් සමග - හරි හෙමින් වත්සන්න

උන් තාම පොඩි එවුන් .........
සීතලට වෙව්ලනා සිවුපාවෙකුගේ
තනිකමේ වේදනා - දෝමනස්සයන්
ආදරේ උණුසුමට මාත්තු වූ
දයාබර වර්ෂාවෝ එක්ව රකිමු

ඒ නොඉඳුල් පුංචි හිත් .........
මහ එවුන් නම් එක කුඩයෙන්-එක අයෙක්
පැනගොසින් ගලකුත් ගසා

**සුභාෂණ ආර්. වඩුගේ**




Volume Two - © 2023 Department of education Sabaragamuwa



# ඈයි වෙනසක්

ලෙළයි කොඩි වැල්
මග දෙපස
ධවල රැළි පාලම් සමග
ශෝක පණිවිඩ
සුවහසක් බැනර්
නිවස මල් වැට වසාගෙන ඇත

වැල නොකැඩී ඇදෙයි
නෑදෑ හිත මිතුරු කැල
සුදුවතින් සැරසිලා
ගත සුවඳ හල හලා
වෙනදා නැගුණු ගී හඬ
මැකීගොස් ගේ තුළින්
ඇහෙන නෑහෙන ගානට
විහිදෙයි පිරිත් දෙසුමක්

තැනක දෙතැනක කැරම් සෙල්ලම්
ඇනෙයි තව කඩදාසි කුට්ටම්
ඇසෙයි බෝතල ගැටෙන රාවය
කොක් සිනාහඬ පරයමින්

නොරැඳී මිනිය ලග මොහොතක් සෙනග බැලූ
හැකි ඉක්මනින් තේ මේසෙට ඇදෙන මලූ
කණපිට හැරී ඇත ගෙයි පින්තූර පලූ
මිනියට තනි රකී පොල්තෙල් පහන් සිළු


**ඩී. නෙත්මි උමාෂා**
**9 ශ්‍රේණිය C**
**ර/ රත්මලවින්න මහා විද්‍යාලය**
**බලංගොඩ**


# සහකම්පනය

දුක සැප දෙකම දෛවය ලෙස උරුම වෙති
මේ දෙස බලන්නට සැම සිත් රුචි නොවෙති
සහකම්පනය පිළිබඳ මේ ලෙස ලියති
මිහිමත සැවොම සහයෝගීව වසති

දුක ගැන කියන්නට එන අය පිළිගන්න
පවසන සියලු දෙය වෙත සිත යොදවන්න
අනේ අපොයි ලෙස ඒ දුක අරගන්න
එම විට දුකට පත් අය සැනසෙයි ඔන්න

ඉපදෙන සියලු දන හට එන දුක්ගින්න
සුහදව බෙදාගෙන ලොව තුළ වැජඹෙන්න
හැකි හැම කෙනාටම පුළුවන් සැනසෙන්න
මේ බව කිසිදාක අමතක නොකරන්න

දුක මෙන් සතුට මිනිසාහට ඇතිවෙනවා
මිනිසා සොයා විත් සතුටින් බරවෙනවා
සමහර දෙනා ඒ සතුටට ගරහනවා
එතනදී මිතුරු දම යටපත් වී යනවා

සතුටු සිතින් මිතුරා හට ජය පතලා
තම හද ද පිරුණු සතුටක් එය බව කියලා
සැනසිලි සුසුම් මැද මිතුරා රජ කරලා
සහකම්පනය පතුරමු හෙට ගැන සිතලා

මිනිසා නොමිනිසා දෙදෙනා මැන ගන්න
හොඳම මිනුම් මෙය බව සිහියට ගන්න
තවකෙකු ලැබූ දුක සැප දෙක විඳ ගන්න
හදවත පුදකරමු අහිතක් නොම වන්න


**පී. එන්. ප්‍රියංකා ශිරෝෂණී සේනාරත්න**






Volume Two - © 2023 Department of education Sabaragamuwa



# මාත් තාත්තෙක්

අනේ බුදු මහත්තයෝ
කියන්ඩ එපා පොලිසියට නම්
රස්සාව නැතිවෙලා
ගොඩ කාලෙක ඉඳන් දැන්...
හැමතැනම වැඩ හෙව්වත්
හම්බවුනේ නෑ අද වෙනකන්
රෑ වෙලා පොල් කඩන්න
ආවේ බැරි තැනම මං

දරූ දෙන්නයි මට
තව දරුවෙක් ලැබෙන්න නෝනට
දවස් ගානක් තිස්සේ
හරිහමන් දෙයක් නෑ උයන්ට...
මගේ උන් බඩගින්නේ
දකිද්දී බැරිවුණා ඉවසන්ට
කොහොමද මං ඉඩදෙන්නේ
හාමතේ උන්ට මියයන්ට..

හිතකින් නෙවේ මහත්තයෝ
ආවේ සොරකම් කරන්නට
වැරදි කරලා නෑ කවදාවත්
ඉඳහිට බිව්වා හැරෙන්නට
අනේ මහත්තයෝ වඳින්නම්
මට සමාවෙන්ට
බුදුබව අත්වෙයි දෙන්න
මට ගෙදර යන්ට


**පී.පී.යූ. පූර්ණජීව**
**කෑ/මාව/තිස්මල්පොල ක.වි.**




# අකුරට නොයා



පොතේ අවසන් පිටුවයි
අද ලිව්වෙ මං
දඬුවම් ලැබෙයි පොත නැතිව
ඉස්කෝලේ ගියොත් නම්
රෑට බත් ලුණු එක්ක
දවාලෙත් වතුර බඩේ පුරවන්
කොහොමද මං කියන්නේ
පොතක් ඕනි කියල දැන්

වල් නෙලන්නට ගිහින්
අම්මා ආවෙත් සවස
වැඩ නිමක් නැති නිසා
සල්ලි දෙන්නේ නෑ තවම
හුළං පොදක් බර නෑ
මල්ලිව වඩාගත්තාම
බඩ පිටට ඇලිල වගේ
පිටි කුක්කුවත් නැතිව

ගෙවල් හදන එක තමයි
තාත්තාගේ රැකියාව
සතුටින් උන්නා අපි
ටික කාලෙකට ඉස්සර .......
තාත්තාට දැන් වැඩ නැතිලු
කල්පනා කරනව නිතරෝම
ම අම්මෝ........බඩ රිදෙනවා මගේ
ඉස්කෝලෙ යන්න බැරිවෙයි හෙටම


**පී.පී.යූ. පූර්ණජීව**
**කෑ/මාව/තිස්මල්පොල ක.වි.**




Volume Two - © 2023 Department of education Sabaragamuwa



# සහෝදර සෙනෙහස

පොඩි කාලේ සෙල්ලමට කළ
වරදක මහත තේරෙනවා හොඳට
දුන් දඬුවමට උණ ගැනුනාම
ආයි නොකරනවාමයි වරද

පරණ මතක මා එක්කම ගිලිහේවී
අලුත් මතක අප අතරට දුව ඒවී
ටිකිරි සිනා සැමදාමත් රැව් දේවී
පුංචි මමත් නුඹත් එක්ක ලොකු වේවි

හෝඩි පොත ද උගන්වන්න - මට පුළුවනි ටීචර් වෙන්න
වැරදුනාම දෙකක් දෙන්න - ආදරයෙන් බලාගන්න
ටිකක් විතර සැරයි ඔන්න - අක්කා නුඹේ මමයි මෙන්න

අපි අතරට තරහක් නම් එන්න එපා
අපි දෙන්නට කඳුලක් දෙන්න එපා
අපෙ අම්මා ගේ ආදරේ නම් අඩු වෙන්න එපා
කවදාවත් අපි නම් වෙන් වෙන්න එපා



**යූ.බී. ගිත්මි කෝෂිලා**
9 C
**රත්මලවින්න මහා විද්‍යාලය**
**බලංගොඩ**

அன்புள்ளங்களே
வறுமையிலும் வறுமை
சொல்லில் அடங்கா கொடுமை....
மானிட சமூகத்தின்
அந்தோ பரிதாபம்........

ஒருவேளை உணவுக்காக
ஏங்கி நிற்கும் பிஞ்சு வயிறுகள்.....
இதை எண்ணாமல் எக் கவலையுமின்றி
சிலர் குப்பையில் எறியும் உணவுகள்.....

மெழுகுவர்த்தி போல் தன்னை
உருக்கி உழைக்கும் பெற்றோர்கள்.....
இதை பொருட்படுத்தாமல் போதையில்
மிதக்கும் இளைஞர்கள்

வறுமையை நோக்கி
கொடுமையை நீக்கி
பிறர் நலம் பேணிட
இன்றே ஒன்றிணைவோம்....

வாருங்கள் அன்புள்ளங்களே

M.N.F Nafla
Kg/Dehi/Thalduwa Muslim M.V
Grade - 8




Volume Two - © 2023 Department of education Sabaragamuwa

# දුටුවොත් මග හරින්නෙපා...




විෂම භාග පිරුණු ලොවක
තුල්‍ය භාග හදනු කෙලෙස
උස්මිටිකම් නැතිබැරිකම්
හිස ඔසවා බලන කලක

අහස පොළොව අතර වෙනස
හඳුනන හදවත් සොයන්න
එක ඉර යට එක හඳ යට
හිනැහෙන මල් ගොමු දකින්න

නො කෙරෙන වෙදකමට අවැසි
කෝදුරු තෙල් සොයා ගන්න
කළුනික හදවත් සොලවා
අතහිත දෙමු ගිනි නිවන්න

නො මළ ගෙයක අබ අහුරක් සොයා යනෙන ගෝතමීල
අහසින් යට බිම් අඟලක් අහිමි වෙච්ච සෝපාකල
නැතිබැරිකම් අඟහිඟකම් ඔටුනු පැළඳි රජ්ජුමාල
දුටුවොත් මග හරින්නෙපා මනුස්සකම් උදුර දාල

**එම්.එම්. ගාමිණී**
**ර/ කහවත්ත ම.ම. විද්‍යාලය**







Volume Two - © 2023 Department of education Sabaragamuwa

# ඉරණම



හදිසියේ දුටිමි සේයාවක් වැව වෙත ඇදෙන
මට කෑ ගැසිණ "අයියෝ" යැයි එකවරම
පොඩි දරුවෙක්ය වැව් දිය මත පොරබදන
ගම්මුන්ගේ උදව්වෙන් ගත්තා ගොඩට

ඉකි බිද බිද හඩයි පොඩි පුතු බිම පෙරලී
වට පිට උන් එවුන් මුහුණට මුහුණ බැලී
බිමහුන් පොඩි පුතුට මම හිමිහිට ළංවී
ඇසුවා ඇයි පුතේ මේ පණ විකනෙ  කියා

මගෙ අම්මා ගියාලු බංගලාවක වැඩට
එනකොට තෑගි ලෙස අරගෙන ආවේලු මම
තාත්තෙක් නැති වුණේ කොහොමද කියා මට
සරදම් කරයි මගෙ යාලුවො  නිතර මට

රෑරා වැටුණි මම මහා වේදනාවකින්
සිපගත්තා නුඹ මගෙ පොඩි මැණික කියා
නුඹෙ අම්මාට බරවුණි නුඹෙ පණ කෙන්ද
රැකගන්නම් පුතුනි සදහට මම නුඹව

මිනිසුන් නොමිනිසුන් සිටිනා මෙ මව්බිමේ
මනුසත් කමත් ගිලිහී ඇත සතර අතේ
දුන් ජීවිතයකට අම්මා වුණි නුඹට පුතේ
මේ සද මඩල මගෙ ලෝකය එළිය කලේ ........................

එල්.කේ. චන්දිමා දමයන්ති විජේරත්න
බලංගොඩ කලාපීය තොරතුරු සම්පත් මධ්‍යස්ථානය

එක පංතියේ කෙලවර බංකුවේ අපි
කෙළි සෙල්ලමෙන් ගත කෙරුවේ හැම දිනම
එනමුත් වෙනසක් ඇති බව අප දෙදෙන
ගුරුතුමී කියනවා ඇහුණේ හැම විටම

උඹ එන්නේ පයින් වග මම දැනගත්තේ
ලෙල්ලට ගෙවී ගෙවී ගිය නුඹගේ සෙරෙප්පුවෙන්
මඩ පැහැ ගැසුණු කමිසේ  පොඩි හිල් අතරින්
සිනහව තමයි මැවුණේ හැමවිට නුඹගෙන්

දින දෙක තුනක් නුඹ නා විට ඉස්කෝලේ
හිත මගේ රිදුම් දුන්නේ ඇත්තට මිතුරේ
ඇයි නුඹ නාවේ හිත ඇසුවේ හැම වේලේ
ඒකයි ආවේ බලන්නට නුඹ මේ පැත්තේ..

එක කමිසයයි තිබ්බේ මගේ පොඩි පුතුට
කියනා විටදි නුඹේ බව හැඩුණේ මටද
ඉරිලා වැරහැලි වූ එය පෙන්වන විට ද
හදවත රිදුම් දුන්නා වෙනදට වැඩිය

එක පන්තියේ ගජ මිතුරන් වුණත් අප
වෙනසක් ඇයිද මට නම් වැටහෙන්නේ නැතිය
දුප්පත් වුණත් නුඹ මට නම් හැමදාම
මගේ මිතුරා තමයි එය  නිසැකයි මිතුර

උපුලි ඉෂාරා මොහොට්ටිආරච්චි




Volume Two - © 2023 Department of education Sabaragamuwa


සහකම්පනය



G.M.D. Sithija Sithumina





සහකම්පනය

Y.R. Vihangi Kawya






නිර්මාණී magazine
Distance Learning mission Sabaragamuwa Provincial Department of Education

# සහකම්පනය





J.M.B.N. Jayalath

J M B N Jayalath
R/Kiriella MMV
teacher
070-1299998.




I.G. Kalpani Mihirangi Jayantha




H.K. Vidudya Vibashi Nimsarani

සහකම්පනය

# සහකම්පනය



D.K. Yethuli Tharulya Amarasinghe


Volume Two- © 2023 Department of Education Sabaragamuwa

# සහකම්පනය




A.Yunal Randunu Amarathunga

# සහකම්පාය

P.W.C. Shavindi Sandamini Withanage




Volume Two- © 2023 Department of Education Sabaragamuwa



J.P. Dasuni Prabodha Ranathunga

# සහකම්පනය

S. Hanchana Yowel Kumarasiri






I.D.M.D. Karunaratha




H.M. Dhanusha Chamath Weerasekara

# සහකම්පනය

P. Pavith Prabashan




සහකම්පනය
නිර්මාණ
e MAGAZINE
57
J.K.W.L. Jayaweera



H. Rivini Induwari Jayasekara

සහකම්පනය



59

එම්.ඒ. ධනුජ් ප්‍රභාෂ්වර මුණසිංහ



සහකම්පනය

Distance Learning mission Sabaragamuwa Provincial Department of Education

M.K. Mihinula Rathnayake



Distance Learning mission Sabaragamuwa Provincial Department of Education
Volume Two © 2023 Department of Education Sabaragamuwa

# සහකම්පනය



H.M. Nethushi Sewwandi Herath

# සහකම්පනය



R.D. Hasindu Chamath Dassanayaka




S.A.D.E. Kularathna

# සහකම්පනය



H.K. Sadeuma Gesadhi Pathirana

# සහකම්පනය




M.G. Isuru Udara

# සහකම්පනය.

නිර්මාණී e magazine

වැඩිහිටියෙකු අමාරුවෙන් හිට ගෙන සිටින විට ඔබට නොදැක්කා ලෙස ඉඳගෙන සිටිය නොහැකියි.



K.T. Warsha Perera


Volume Two- © 2023 Department of Education Sabaragamuwa




නිර්මාණී e magazine



A.N. Meuni Asiringala


Volume Two- © 2023 Department of Education Sabaragamuwa



M.K. Mihinula Rathnayake

K. Senali Iyara Silva



# සහකම්පනය



J.M. Pramudi Sanchala Randinuki



J.A. Nisini Sehasna Jayawickrama




Volume Two- © 2023 Department of Education Sabaragamuwa

# සහකම්පනය



W.H.A. Osanda


Volume Two- © 2023 Department of Education Sabaragamuwa



# D.P.S. Premathilaka

Distance Learning mission Sabaragamuwa Provincial Department of Education

Volume Two- © 2023 Department of Education Sabaragamuwa



නිර්මාණ

සහකම්පනය

සහකම්පනය

# නිර්මාණ

J. Sandhesh





G.S.I. Ranasingha


Volume Two- © 2023 Department of Education Sabaragamuwa



B.A. Theekshana Thathsarani

G.M. Methupa Sasmal Bimandiw




සහකම්පනය
4 792094 003017
79
Roshmi Anuradha Muthukumarana
Distance Learning mission Sabaragamuwa Provincial Department of Education






Distance Learning mission Sabaragamuwa Provincial Department of Education
Volume Two - © 2023 Department of Education Sabaragamuwa




A. Dinendra Thejasvi Amarathunga





Volume Two- © 2023 Department of Education Sabaragamuwa

# සහකම්පනය



A.A.U. Amarathunga


Volume Two- © 2023 Department of Education Sabaragamuwa







A. Sanduni Chathurika Sandeepani Kumarathunga





W.H. Amashi Sithumini Karunadasa

# සහකම්පනය




R. Seniru Hiwin Rathnayaka



K.G. Sethumsa Chanthuli Dias



Majuwana Gamage Isuru Uadara



P.C. Kethmini Wijesingha






J.A. Subhartha Sithumini Jayawickrama



සහකම්පනය
නිර්මාණ
magazine
H. Chenuka Dhananjana Premarathna
90
Distance Learning mission Sabaragamuwa Provincial Department of Education


91
සහකම්පනය
එම්.කේ. ඉදුෂ දිනෙත්
Distance Learning mission Sabaragamuwa Provincial Department of Education





සහකම්පනය

G.A. Thedaswin Himsara Premadasa





සහකම්පනය

W.A. Methuka Denuwan



94

සහකම්පනය

L.H. Apsara





J. Chenula Nuntharu



සහකම්පනය
D.M. Pumindu Tevin Dissanayaka



U.V. Sanindee Mandara



සහකම්පනය

R.M. Lisara Thulani Rathnayaka


සහකම්පනය
N.R.C.J. Bandara



සහකම්පනය
100
J. Yethum Dintharu
100

# නිර්මාණී



101

**Onadi Nesha Damsuwi**
WP/GM/ Urapola Primary College, Urapola




# සහකම්පනය

J. Yesath Basilu

සහකම්පනය

N. Pasadi Onara



# නිර්මාණි

මීළඟ කලාපයේ තේමාව

# වෙනස

## වෙනස්ව

ඔබේ නිර්මාණ එවන්න...........

# FAQ

**නිර්මාණි ඉදිරි කලාප වෙත නිර්මාණ යොමුකළ හැක්කේ කෙසේ ද?**

**071 994 8853/ 071 952 2894 /071 817 9565**

මෙම දුරකථන අංක වෙත whatsapp පණිවිඩයක් යොමු කර නිර්මාණි ලේඛක මණ්ඩල සමූහයට එක්වන්න

**නිර්මාණ යොමු කළ හැක්කේ සබරගමු පළාතේ නිර්මාණකරුවන්ට පමණ ද?**

නැත. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඕනෑම අයෙකුට නිර්මාණ එවිය හැක

**ඒ ඒ කලාපයන් හී තේමාව දැනගන්නේ කෙසේ ද?**

www.enenapiyasa.lk වෙබ් අඩවියට පිවිසෙන්න එසේම සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිල සමාජ ජාල මාධ්‍ය හා සම්බන්ධ වන්න

**නිර්මාණි යනු කාව්‍ය නිර්මාණ සංග්‍රහයක් ද?**

නැහැ , තේමාවට අදාළ ඕනෑම නිර්මාණයක් එවිය හැකි ය